## පටුන


1. හැඳින්වීම ..... 1
2. අරමුණු ..... 1
3. කෙටි ඓතිහාසික විශ්ලේෂණයක් ..... 1
4. ගවේෂණය ..... 3
5. ක්‍රමවේදය ..... 3
6. පුරාවිද්‍යාත්මක ස්ථාන ..... 4

6.1 ස්ථාන අංක 1 - ගල්ටැම්යාය ස්තූපය ..... 4
6.2 කුරගල ..... 5
6.2.1 ස්ථාන අංක 2 - කුරගල ගුහා අංක 1
6.2.2 ස්ථාන අංක 3 - කුරගල ගුහා අංක 2
6.2.3 ස්ථාන අංක 4 - කුරගල ගුහා අංක 3
6.2.4 ස්ථාන අංක 5 - කුරගල ගුහා අංක 4
6.2.5 ස්ථාන අංක 6 - කුරගල ගුහා අංක 5
6.2.6 ස්ථාන අංක 7 - කුරගල ගුහා අංක 6
6.2.7 ස්ථාන අංක 8 - කුරගල ගුහා අංක 7
6.2.8 ස්ථාන අංක 9 - කුරගල ගුහා අංක 8
6.2.9 ස්ථාන අංක 10 - කුරගල ගුහා අංක 9
6.2.10 ස්ථාන අංක 11 - කුරගල ගුහා අංක 10
6.3 ස්ථාන අංක 12 - කුම්භීය නිබනනයක් ..... 11
6.4 ස්ථාන අංක 13 - ගල කොටා සකස් කළ පඩි පෙළ ..... 11
6.5 ස්ථාන අංක 14 - ගල් ආකරය ..... 11
6.6 ස්ථාන අංක 15 - තවත් ගල් ආකරයක් ..... 12
6.7 පබ්බතාරාමය ..... 12
6.7.1 ස්ථාන අංක 16 - පබ්බතාරාමය ගුහා අංක 1
6.7.2 ස්ථාන අංක 17 - පබ්බතාරාමය ගුහා අංක 2
6.7.3 ස්ථාන අංක 18 - පබ්බතාරාමය ගුහා අංක 3
6.7.4 ස්ථාන අංක 19 - පබ්බතාරාමය ගුහා අංක 4
6.8 ස්ථාන අංක 20-විල්ආර ගුහාව ..... 13
6.9.1 ස්ථාන අංක 21 - ඉද්දගල වැව
6.9.2 ස්ථාන අංක 22 - ඉද්දගල පුරාණ ජනාවාසය
6.9.3 ස්ථාන අංක 23 - ඇඳගල පුරාණ මාලකය
6.9.4 ස්ථාන අංක 24 - ඇඳගල නටබුන්
6.10 ස්ථාන අංක 25-යබොර ගොඩැල්ල ..... 15
6.11 ස්ථාන අංක 26 - තිරිවාණා මෙවලම් පැතිර පැවති ප්‍රදේශය ..... 15
6.12 ස්ථාන අංක 27 - බෝ මළුකන්ද ..... 15
6.13 ස්ථාන අංක 28 - උල්ගල ගුහාව ..... 16
6.14 ස්ථාන අංක 29 - කිරිමකුල්ගොල්ලේ ඇති පුරාණ වැව ..... 16
6.15 කිරිමකුල්ගොල්ල ..... 16
6.15.1 ස්ථාන අංක 30 - ගුහා අංක 1
6.15.2 ස්ථාන අංක 31 - ගුහා අංක 2
6.15.3 ස්ථාන අංක 32 - ගුහා අංක 3
6.15.4 ස්ථාන අංක 33 - ගුහා අංක 4
6.15.5 ස්ථාන අංක 34 - ගුහා අංක 5
6.16 ස්ථාන අංක 35 - මච්ගල පිහිටි පුරාණ ජනාවාස ගොඩැල්ල ..... 19
6.17 ටැම්කැටිය ..... 19

6.17.1 ස්ථාන අංක 36 - ගුහා 1
6.17.2 ස්ථාන අංක 37 - ගුහාව 2
6.17.3 ස්ථාන අංක 38 - ගුහාව 3
6.17.4 ස්ථාන අංක 39 - ගුහා 4
6.17.5 ස්ථාන අංක 40 - ගුහාව 5
6.17.6 ස්ථාන අංක 41 - ගුහාව 6
6.18 ස්ථාන අංක 42 - ජනාවාස ගොඩැල්ල ........ 21
6.19 වැලිපොතේයාය ........ 21
6.19.1 ස්ථාන අංක 43 - ගුහාව 1
6.19.2 ස්ථාන අංක 44 - ගුහාව 2
6.19.3 ස්ථාන අංක 45 - ගුහාව 3
6.19.4 ස්ථාන අංක 46 - ගුහාව 4
6.19.5 ස්ථාන අංක 47 - ගුහා අංක 5
6.19.6 ස්ථාන අංක 48 - ගුහාව 6
6.19.7 ස්ථාන අංක 49 - ගුහාව 7
6.19.8 ස්ථාන අංක 50 - ගුහාව 8
6.20 ස්ථාන අංක 51 - බුදුගල නටබුන් ........ 22
7. සෙල්ලිපි ........ 23
7.1 පුරා අක්ෂරවේදය ........ 23
7.1.1 උඩුපියන් ගල්ගේ ලෙන් ලිපිය
7.1.2 සුදර්ශනාරාමය ලෙන් ලිපිය
7.1.3 කිරිමකුල්ගොල්ල ලෙන් ලිපි 1
7.1.4 කිරිමකුල්ගොල්ල ලෙන්ලිපි 2
7.1.5 කිරිමකුල්ගොල්ල ලෙන් ලිපි 3
7.1.6 ටැම්කැටිය ලෙන් ලිපිය 1
7.1.7 ටැම්කැටිය ලෙන් ලිපි 2
7.1.8 ටැම්කැටිය ලෙන් ලිපිය 3
7.1.9 පබ්බත විහාරයේ ලෙන් ලිපි 1
7.1.10 පබ්බත විහාර ලෙන් ලිපි 2
7.1.11 පබ්බත විහාර ලෙන් ලිපි 3
7.1.12 පුහුල්යාය ලෙන් ලිපිය
7.1.13 කුරගල ලෙන් ලිපිය 1
7.1.14 කුරගල ලෙන් ලිපි 2
7.2 හිරිගල් පිළිමය ........ 30
7.3 අරාබි සෙල්ලිපිය ........ 30
8. සමෝධානය ........ 31
කෙටි යෙදුම් ........ 32
ආශ්‍රිත ග්‍රන්ථ ........ 32

**සන්නිදර්ශන නාමාවලිය**

සිතියම්

1. වාර්තාගත කළ පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති ස්ථානවල ව්‍යාප්තිය

සන්නිදර්ශන

1. කුරගල කන්දේ උතුරු බෑවුමෙන් සොයාගත් ශිලාමෙවලම්වලින් කිහිපයක් (තිරිවාණා)
1. ගල්ටැම්යාය පුරාණ බෞද්ධ අරාම සංකීර්ණයේ බිම් සැලැස්ම
2. කුරගල ගුහා අංක 3 හි බිම් සැලැස්ම සහ පැති පෙනුම
3. කුරගල ගුහා අංක 4 හි බිම් සැලැස්ම සහ පැති පෙනුම
4. කුරගල ගුහා අංක 6 හි බිම් සැලැස්ම සහ පැති පෙනුම
5. කුරගල ගුහා අංක 7 හි බිම් සැලැස්ම සහ පැති පෙනුම
6. කුරගල ගුහා අංක 8 හි බිම් සැලැස්ම සහ පැති පෙනුම
7. කුරගල පබ්බත විහාරයේ බිම් සැලසුම සහ පැති පෙනුම

8 (අ). පබ්බත විහාරයේ ගුහා අංක 1 (අ) හි බිම් සැලසුම සහ පැති පෙනුම

8 (ආ). පබ්බත විහාරයේ ගුහා අංක 1 (ආ) හි බිම් සැලසුම සහ පැති පෙනුම

9. පබ්බත විහාරයේ ගුහා අංක 2 හි බිම් සැලසුම සහ පැති පෙනුම
10. පබ්බත විහාරයේ ගුහා අංක 3 හි බිම් සැලසුම සහ පැති පෙනුම
11. පබ්බත විහාරයේ ගුහා අංක 4 හි බිම් සැලසුම සහ පැති පෙනුම
12. විල්ආර ගුහාවේ බිම් සැලසුම සහ පැති පෙනුම
13. ඇඳගල නටබුන්වල බිම් සැලසුම
14. උල්ගල ගුහාවේ බිම් සැලසුම සහ පැති පෙනුම
15. කිරිමකුල්ගොල්ල ගුහා අංක 1 හි බිම් සැලසුම සහ පැති පෙනුම
16. කිරිමකුල්ගොල්ල ගුහා අංක 2 හි බිම් සැලසුම සහ පැති පෙනුම
17. කිරිමකුල්ගොල්ල ගුහා අංක 3 හි බිම් සැලසුම සහ පැති පෙනුම
18. කිරිමකුල්ගොල්ල ගුහා අංක 4 හි බිම් සැලසුම සහ පැති පෙනුම
19. කිරිමකුල්ගොල්ල ගුහා අංක 5 හි බිම් සැලසුම සහ පැති පෙනුම
20. ටැම්කැටිය ගුහා අංක 1 හි බිම් සැලසුම සහ පැති පෙනුම
21. ටැම්කැටිය ගුහා අංක 2 හි බිම් සැලසුම සහ පැති පෙනුම
22. ටැම්කැටිය ගුහා අංක 3 හි බිම් සැලසුම සහ පැති පෙනුම
23. ටැම්කැටිය ගුහා අංක 4 හි බිම් සැලසුම සහ පැති පෙනුම
24. වැලිපොතේයාය ගුහා අංක 1හි බිම් සැලසුම සහ පැති පෙනුම

25 වැලිපොතේයාය ගුහා අංක 2හි බිම් සැලසුම සහ පැති පෙනුම

26. වැලිපොතේයාය ගුහා අංක 4 හි බිම් සැලසුම සහ පැති පෙනුම
27. බුදුගල ගුහාවේ බිම් සැලසුම සහ පැති පෙනුම
28. බුදුගල බෞද්ධ ආරාමික සංකීර්ණයේ බිම් සැලසුම
29. කුරගල නව ඉදිකිරීම් සිදු කළ ප්‍රදේශය

ඡායාරූප

1. කල්තොට තන්ජන්තැන්න, ගල්ටැම්යාය පුරාණ බෞද්ධ ආරාමික සංකීර්ණයේ ඇති සංරක්ෂණය කරන ලද ගඩොලින් කළ ස්තූපය.
2. ගල්ටැම්යාය බෞද්ධ ආරාමික සංකීර්ණයේ ඇති නටබුන් ගොඩනැගිල්ලක්. මෙය බොහෝ විට පිළිම ගෙයක් විය හැකි ය.
3. කුරගල කන්දේ පර්වත සහිත භූමිදර්ශනය. මෙහි ඇති බොහෝමයක් ගුහා ප්‍රාග්ඓතිහාසික කාලයේ සිට ඓතිහාසික කාලපරිච්ඡේදය දක්වා විවිධ කාලවකවානුවල දී භාවිතා කර ඇත.
4. කුරගල ගුහා අංක 1. ගුහාව ඉදිරියේ තනා ඇති ගොඩනැගිල්ල මුස්ලිම් දේවස්ථානයයි.

5. කුරගල කන්දේ පිහිටා ඇති විශාල ගුහාවලින් එකක්. කුරගල වැසියන් මෙම ගුහාව ලුණුගල්ගේ යන අන්වර්ථ නමින් ද හඳුන්වයි.

6.කුරගල ඇති කටාරම් කෙටූ ගුහාවක්. වර්තමාන නරඔන්නන් විසින් එම ගුහාවලට කරන ලද හානිය මෙම ඡායාරූපයෙන් පැහැදිලි වේ.

7. පුරාණයේ ගල් වළක් වශයෙන් භාවිත කර තිබෙන ස්ථානයකි. ගල්මත කළ කුඩා සිදුරු තවමත් පෙනෙන්නට ඇත.

8. කුරගල ලෙන් ආරාමික සංකීර්ණයේ ඇති ලෙන් සමුච්ඡයෙහි ස්වාභාවික පිහිටීම.

9. කල්තොට පබ්බතාරාමයේ පිහිටා ඇති ගුහාවක්. මෙහි ඇති බොහෝමයක් ගුහා මෑතකාලයේ දී විශාල වශයෙන් වෙනස්කිරීම්වලට ලක් කර ඇති අතර මෙම ගුහාව ඉදිරියේ ඇති ගරාවැටුණු මඩුව එලෙස ඉදි කර ඇති වැසිකිලියකි.

10. පබ්බතාරාමයේ පිහිටා ඇති ලෙන් ආවාසයක්

11. පබ්බතාරාමය පිහිටි පර්වත සහිත භූමිදර්ශනයේ ඇති ස්වාභාවිකව පිහිටි ගුහාවක්. මෙම ගුහාවේ සෙල්ලිපියක් කොටා ඇත.

12. කල්තොට පබ්බතාරාමයේ ඇති තවත් ස්වාභාවිකව පිහිටි ගුහාවක්. මෙම ගුහාව ඉදිරියේ ඇත්තේ භික්ෂූන්වහන්සේලාට වාසය සඳහා ඉදිකරන ආවාසයේ ගල් අතුරා සැකසූ පාදමයි.

13. ඇඳගල ඇති ගල් පර්වතයක් සාරා සකස් කළ වාස්තු විද්‍යාත්මක අංග. මෙහි ඇති ගල සාරා සකස් කරන ලද කණු වළවල් මගින් එහි තිබූ ගොඩනැගිල්ල ලී කුළුණු යොදා සකස් කළ බව පැහැදිලි වේ.

14. දියවින්නේ පිහිටි ගල්ගුහාව. මෙහි 1950 දශකයේ දී පී. ඊ. පී. දැරණියගල මහතා විසින් කැණීම් කටයුතු සිදු කර ඇත.

15. මෙය කිරිමකුල්ගොල්ලේ පිහිටා ඇති ගුහාවකි. කටාරම් කඩා වැටී පැවතීම එහි පෞරාණිකත්වය පිළිබඳ මනා නිදර්ශකයකි.

16. කල්තොට පුහුල්යාය සුදර්ශනාරාමයේ පිහිටි ලෙනෙහි ඇති කටාරම.

17. කල්තොට පුහුල්යායේ ඇති කටාරම් කෙටූ තවත් ගුහාවක්. මෙහි සෙල් ලිපියක් කොටා ඇත.

18. බුදුගල ඇති ස්වාභාවික ගල්පුවරුවක කොටා ඇති සිංහ රුව. සිංහරුවට ඉදිරියෙන් අලියෙකුගේ හොඬවැලක සටහනක් ඇඳ ඇත. ගලෙහි රේඛා ඇඳි පෘෂ්ටය විශාල වශයෙන් ඛාදනයට ලක්වීම නිසා එම රුව ස්පර්ශ ලාංඡන සටහනෙහි මැනවින් පිටපත් වී නැත.

19. ඉහත සඳහන් කළ ගල් පෘෂ්ටය මත ඇඳි තවත් රූ සටහන්. එහි මානව රූ දෙකක් (පුරුෂයෙකුගේ සහ ස්ත්‍රියකගේ) සහ තවත් ජ්‍යාමිතික සංකේත කිහිපයක් ඇඳ ඇත. මෙම රූපවල අර්ථය දුරවබෝධය.

20. කුරගල ඇති ගඩොලින් කළ සංරක්ෂණය කරණ ලද දැගැබ.

21. කුරගල ඇති නටබුන් ගොඩනැගිලිවලින් එකක්.

22. කල්තොටින් සොයා ගත් හිරිගල් බෝධිසත්ත්ව රූපය. මෙය මේ වන විට කල්තොට ඇති පුරාවිද්‍යා සංචාරක බංගලාවේ ප්‍රදර්ශනයට තබා ඇත.

23. කුරගල පර්වතයක මතුපිට ආරාබි කියුෆික් අක්ෂරයෙන් කරන ලද ක්‍රිස්තු වර්ෂ 10 වෙනි ශතවර්ෂයට අයත් යැයි සිතිය හැකි අභිලේඛනය.

24. කුරගල ඇති ආරාබි අභිලේඛනයේ නෙත් පිටපත.

## ස්තුතිය

මෙම වාර්තාව මගින් ඉදිරිපත් කරන පුරාවිද්‍යාත්මක ගවේෂණය සඳහා පිරිවැය දැරීම වෙනුවෙන් පන්නිපිටිය දෙව්රම්වෙහෙර අධිපති අතිපූජ්‍ය කොළොන්නාවේ සුමංගල නාහිමිපාණන්වහන්සේටත් එම විහාරයේ දායක සභාවටත් අප පළමුවෙන්ම අපගේ ගෞරවපූර්වක ස්තුතිය පුද කළ යුතුය. පූජ්‍ය පස්සරමුල්ලේ දයාවංස හිමියන් මෙම ව්‍යාපෘතිය යථාර්ථයක් කිරීමට සෑම අවස්ථාකම කැප වී ක්‍රියා කළහ. ඒ පිටුපස අප මිත්‍ර නන්ද, දුලිප්, චමිල ඇතුළු තවත් බෙහෝදෙනක් කටයුතු කළහ. ඒ සියළුදෙනාටම අපි ඉතසිතින් කෘතවේදී වෙමු. මෙම වැඩසටහන ක්‍රියාත්මකව පැවති සමයේ මහජනයා දැනුවත් කිරීමේ අරමුණින් රැස්වීම් සංවිධානය කිරීමටත්, බලංගොඩ ප්‍රදේශයේ පාසැල් ගුරුවර-ගුරුවරියන් දැනුවත් කිරීමටත් ක්ෂෙත්‍ර මූලික වැඩමුළු සංවිධානය කිරීමටත් පූජ්‍ය ඉඹුල්පේ විජිතවංස හිමියන් සිය ශ්‍රමය හා කාලය කැප කළ හ. උන්වහන්සේගේ උනන්දුව පමණටත් වඩා අපගේ ධෛර්යය වැඩි කිරීමට හේතු වූ බව මෙහි ලා සඳහන් කළ යුතු ය. ඒ හිමියන්ට අපි මහත් සේ කෘතඥ වෙමු. බලංගොඩ ප්‍රාදේශීය ලේකම් චම්පික ධර්මපාල මහතා මේ වැඩසටහන සම්බන්ධයෙන් ඉටු කළ මෙහෙය අප විසින් අගය කළ යුතු ය. එහි දී ඔහු අප වෙත ප්‍රතිචාර දැක් වූයේ රජයේ වගකිව යුතු නිලධාරියෙක් ලෙස පමණක් නොව මහත් උනන්දු සහගත නිරීක්ෂකයෙකු ලෙස ය. ඔහුගේ සහයට අපි නොමඳව ස්තුතිවන්ත වෙමු. අපගේ කණ්ඩායම ක්ෂෙත්‍රයේ දී මුහුණ දුන් දුෂ්කර අවස්ථා නිහඬව අවබෝධ කර ගත් පුද්ගලයෙකු සිටියේ ය. ඒ බලංගොඩ ලංකා බැංකුවේ කළමනාකාර තැන්පත් වීරසිංහ බණ්ඩාර මහතා ය. ඔහු සෑම අවස්ථාවකම අප කණ්ඩායම වෙත කාරුණික වීමට අමතක නොකළේ ය. බලංගොඩ පොලිස් ස්ථානයේ මහජන සම්බන්ධතා අංශයේ අප හිතවත් ඉරෝෂන් ජයසේකර මහතා විසින් ඉටු කළ සේවය ද අය කළ යුතු ය. අවසාන වශයෙන් බලංගොඩ උරුමය ආරක්ෂා කිරීමට උනන්දුවක් දැක් වූ සියළුදෙනා හට අපි ස්තුතිවන්ත වෙමු.

මෙම වැඩසටහනේ සාර්ථකත්වයට උර දුන් අමතක කළ නොහැකි තවත් පිරිසක් සිටී. ඒ අපගේ කේන්ද්‍රීය ක්ෂෙත්‍ර කණ්ඩායම හොබවන ලක්මාල් වතුයාය, කුංචන මාතොටආරච්චි, ලලීන්ද්‍ර සන්නස්ගම, කුසල් ගුණසේකර, ඉන්ද්‍රජිත් සෝමතිලක, දුල්මිණි ඒකනායක, ඒ.අයි.රාජිනී, අකිලා වැලිවත්ත, රවිනි ද සිල්වා සහ සංඛ රන්දෙනිකුමාර යන පශ්චාත් උපාධි ශිෂ්‍යයින් ය. ඔවුන් සිය නිර්දිෂ්ට පුහුණුවීම්වලට අමතරව වැඩසටහනට ක්‍රියාකාරී ලෙස දායක වූ බව කෘතවේදීව මෙහි සටහන් කරමු. ඊට අමතරව තන්ජන්තැන්නේ රත්තරන්හාමි මහතා අප වෙත දැක් වූ නොමසුරු සහය ද මෙම වැඩසටහන දියත් කිරීමට සැලසුම් කළ අවස්ථාවේ සිට නා නා අයුරින් උදව් උපකාර කළ අය ද අගය කළ යුතුය.

පූජ්‍ය කොළොන්නේ ශාන්ත විජය හිමි, පූජ්‍ය මැදගම ධම්මානන්ද හිමි, පූජ්‍ය වටද්දර ඥානිස්සර හිමි, පූජ්‍ය මැද්දේගම චන්දාලංකාර හිමි, බුදුගල පිනවංශ හිමි, පූජ්‍ය බුදුගල සෝමරතන හිමි, රංජිත් අමරතුංග ඩබ්ලිව්. හෙලවංශ, හේමන්ත වෙලගේ. වෙලගේ, දයානන්ද බෙනරගම මහතා, පුරාවිද්‍යා සහකාර අධ්‍යක්ෂක (සබරගමු කලාපය). හා කල්තොට පුරාවිද්‍යා සංචාරක බංගලා භාරකරු සමන්ත ඇතුළු සියළු දෙනාට අපගේ හෘදයාංගම කෘතවේදී බව පල කරමු.

රාජ් සෝමදේව *PhD*
අනූෂා වන්නිනායක *MSc*
දිනේෂ් දේවගේ *MSc*

25 මැයි 2015
පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
නො.407, බෞද්ධාලෝක මාවත
කොළඹ 7.

# කල්තොට ගවේෂණය 2014 - අදියර 1

රාජ් සෝමදේව
අනූෂා වන්නිනායක
දිනේෂ් දේවගේ

සිංහල පරිවර්තනය
දිනේෂ් දේවගේ

## 1.හැඳින්වීම

පුරාවිද්‍යා අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ අවසරය පරිදි රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කල්තොට මොහොර ප්‍රදේශයේ, මතුපිට පිරික්සුම් ගවේෂණයක් සිදු කරනු ලැබී ය. කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සේවය කරන වෘත්තීය පුරාවිද්‍යාඥයෙකුගේ ප්‍රධානත්වයෙන් යුත් මෙම ගවේෂණ කණ්ඩායමට එම ආයතනයේම පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන් අටදෙනෙක් ද ඇතුළත් විය. ගවේෂණයට අදාල ක්ෂේත්‍ර වැඩකටයුතු 2014 වර්ෂයේ මාර්තු 26 සිට අප්‍රේල් 8 තෙක් සහ මැයි 18 සිට ජුනි 5 දක්වා වූ කෙටි වාර දෙකකින් සම්පූර්ණ කරන ලදී. මෙම වාර්තාව මගින් එළි දැක්වෙන්නේ එම ගවේෂණයේ ප්‍රතිඵල සමාලෝචනයයි.


## 2. අරමුණු

'දඩයම්කරුවන්ගේ සංක්‍රාන්තිය' මැයෙන් යුතු හොලෝසීන දඩකරු-අන්නගවේශකයන්ගේ පාරිසරික අනුවර්තනය පිළිබඳ කේන්ද්‍රගත වූ පුරාවිද්‍යාත්මක ව්‍යාපෘතියක් 2010 වර්ෂයේ දී ආරම්භ කළ අතර එහි දී භූ විද්‍යානුකූලව උතුරු දිශාවේ හෝර්ටන් තැනිතලාවේ සිට දකුණු දෙසින් ඇති කල්තොට මොහොර දක්වා දිවෙන මධ්‍ය කඳුවැටියේ දකුණු බෑවුම් ප්‍රදේශය ගැන ප්‍රධාන වශයෙන් අවධානය යොමු විය. 2010 වර්ෂයේ සිට කර ගෙන යනු ලබන ක්ෂේත්‍ර වැඩ කටයුතු භූගෝල විද්‍යාත්මකව මෙම ව්‍යාප්ති මාර්ගයේ ඉහළ කඳුකර කොටසට සීමා වූ අතර මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රාග්ඓතිහාසික ජනතාව ගැවසුනු තැන් බොහෝමයක් හඳුනා ගැනීමට හැකියාව ලැබිණි.


ප්‍රදේශයේ සිදු කරන ලද පුරාවිද්‍යාත්මක කැණීම් අවස්ථා තුනක දී ක්‍රිස්තු පූර්ව තෙවන සහස්‍රක වර්ෂයේ සිට ක්‍රිස්තු පූර්ව දෙවන සහස්‍රක වර්ෂය දක්වා ප්‍රාග්ඓතිහාසික කණ්ඩායම් මෙම ප්‍රදේශයේ වාසය කළ බව හෙළිවන විකිරණශීලී දින දෙකක් ලබා ගැනීමට හැකි විය (Somadeva 2010 & 2014). ව්‍යාපෘතිය තුළින් ඊළඟට අපේක්ෂා කළේ සාර්ව පර්යේෂණ සැලසුමේ ඇති කඳුකර බෑවුම, පහත් බිම් තැනිතලාව මුන ගැසෙන මොහොර ප්‍රදේශය විමර්ශනයට ලක් කිරීමයි. පුරා-පාරසරික පර්යාවලෝකනයකින් බලන කල්හි මෙම මොහොර ප්‍රදේශය එයට අනන්‍ය අන්තර්කලාපීය දේශගුණික ලක්ෂණ හේතුවෙන් එහි වාසය කළ ප්‍රාග්ඓතිහාසික ජනයාට වඩාත් තීරණාත්මක භූමි භාගයක් වන්නට ඇත. එහි ඉදිරියේ දී කරන ක්ෂේත්‍ර වැඩකටයුතු මෙම ප්‍රදේශයෙන් හමුවන පුරාවිද්‍යාත්මක ස්ථාන හඳුනා ගැනීම සහ වාර්තා කිරීම යන මූලික උත්සාහය මත උපන්‍යාස ගත කෙරිණි. මේ ආකාරයෙන් මෙම ගවේෂණය ද සැලසුම් කළේ ඉහතින් සඳහන් කළ මුල් අරමුණ මගින් පැන වූ අවශ්‍යතාවන්ට ගැළපෙන පරිද්දෙනි.

## 3. කෙටි ඓතිහාසික විශ්ලේෂණයක්

ප්‍රාග්ඓතිහාසික දඩකරු-අන්නගවේෂකයින් කල්තොට මොහොර සහ ඒ අවට ප්‍රදේශවල ජීවත් වූ බවට සනාථ කරන තැන් තුනක් හඳුනා ගැනීමට හැකි ය. එනම් (අ) බෙල්ලන්බැඳිපැලැස්ස (ආ) උඩුපියන් ගල්ගේ සහ (ඇ) කුරගල යන ස්ථාන තුනයි. විවෘත ප්‍රාග්ඓතිහාසික බිමක් වන බෙල්ලන්බැඳිපැලැස්ස පිහිටා ඇත්තේ උඩවලව වන රක්ෂිතය තුළ ය. එය අවස්ථා දෙකක දී පුරාවිද්‍යාත්මක විමර්ශනයන්ට ලක් වූ අතර (Deraniyagala (Sr.) 1958 & Perera 2010) මෑතකම ලබා ගත් දිනය අදින් වර්ෂ 7800 කට පෙර කාලයකට අයත් ය. මෙම ස්ථානයෙන් ප්‍රාග් ඓතිහාසික පුද්ගලයින් 30-35 අතර සංඛ්‍යාවකට අයත් අස්ථි අවශේෂ සොයා ගත් අතර ඒ පිළිබඳ පෘථුලව අධ්‍යයනය කර ඇත (Kennedy 1962; 1965; 1971; 1976; Deraniyagala (Sr.) 1979). උඩුපියන් ගල්ගේ පිහිටා ඇත්තේ මොලමුරේ කඳුවැටියේ දකුණු බෑවුමේ ය. මෙය දැරණියගල (1957) විසින් ඉතා කෙටි කාලයක් තුළ කණින ලදී. එහි දී ඔහු විසින් ශිලාමෙවලම්, වර්ණාලේපිත වළං කැබලි (රතු වර්ණය මත ඇඳි කලු ඉරි) සහ ගුහා අභ්‍යන්තරයෙන් සොයා ගත් ධාන්‍ය වර්ගයක් අඩංගු මැටි වළඳ ඇතුළු වැදගත් සාධක කිහිපයක් අනාවරණය කර ගැනීමට සමත් විය. කඳු බෑවුමේ පිහිටා ඇති ස්වාභාවික ගල්ගුහා බොහෝමයක් 1960 දශකයේ දී පුරාවිද්‍යා




*සිතියම් අංක 1. වාර්තාගත කළ පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථලවල ව්‍යාප්තිය.*



*ඡායාරූපය අංක 1. කල්තොට තන්ජන්තැන්න, ගල්ටැම්යාය පුරාණ බෞද්ධ ආරාමික සංකීර්ණයේ ඇති සංරක්ෂණය කරන ලද ගඩොලින් කළ ස්තූපය (ඡායාරූපය. රාජ් සෝමදේව).*

දෙපාර්තමේන්තුවේ විමර්ශනයට ලක් විය. ඔවුන්ගේ මූලික අභිප්‍රාය වූයේ එම ගුහා සමහරක කටාරම්වලට යටින් තිබූ, උදාහරණයක් වශයෙන් දියවින්න, කිරිමකුල්ගොල්ල, වැලිපොතේයායේ සුදර්ශනාරාම විහාරය සහ කුරගල ආදි තැන්හි තිබූ සෙල්ලිපිවල ස්පර්ශ ලාංඡන ලබා ගැනීමයි. (*ASCAR* 1952; 1961-62; *JRASB* XXXIII; *CJS* (G) II: 197; Rev. Gnawimala 1967:264-274; Dias 1991; Rev. Ellavala 2008).

## 4. ගවේෂණය

ගවේෂණය අනුක්‍රමික අදියර තුනකින් කිරීමට සැලසුම් කෙරිණි. 2014 වර්ෂයේ මාර්තු සහ මැයි මාසවල දී කෙටි ක්ෂේත්‍ර වැඩසටහන් දෙකක් සිදු කළේ ය. නිරීක්ෂණයට ලක් කරන ලද මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 514 කි. ක්ෂේත්‍ර නිරීක්ෂණ කුරගල සහ තන්ජන්තැන්නේ සිට මොලමුරේ කඳුවැටියේ දකුණු හැරවුමේ පිහිටි දියවින්න දක්වා සිදු කළේ ය (සිතියම.1). මෙහි දී පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථාන 51 ක් විමර්ශනයට ලක් කරන ලද අතර ඒවායින් සමහරක් පෙර දී හඳුනාගෙන පැවති අතර ඒවායේ ඓතිහාසිකත්වය පිළිබඳ විස්තර ගවේෂණය පටන් ගැනීමට පෙර ප්‍රකාශයට පත් කර තිබිණි. එම ස්ථාන 51 විවිධ කාල පරාසවලට අයත් වන අතර එවැනි කාල-විවිධත්වයකින් පෙන්නුම් කරන්නේ පුරාණ කාලයේ දී මෙම ප්‍රදේශයේ පැවති මානව ජනාවාසවල අඛණ්ඩතාවයි.

## 5. ක්‍රමවේදය

ගවේෂණය කළ යුතු ප්‍රදේශය විමර්ශනය කිරීම සඳහා ක්ෂේත්‍රයේ ඇවිද යාමේ ක්‍රමය අනුගමනය කෙරිණි. ඒ සඳහා පූර්වයෙන් නිශ්චය කළ වර්ග කිලෝමීටර් 0.5 ක ප්‍රමාණයේ චතුරස්‍රවලින් සමන්විත ජාලයක් මගින් ආවරණය වන ප්‍රදේශයක් තෝරා ගැනිණි. ගවේෂණයේ දී මූලික අවධානය යොමු කළේ පුරාවිද්‍යාත්මක භව්‍යතාවක් ඇති තැන් හඳුනා ගැනීමට සහ ඒවා විස්තාරාත්මකව වාර්තා කිරීම සඳහා ය. එවැනි භව්‍යතාවකින් යුත් එක් එක් තැන්වලට සාපේක්ෂ දිනයන් ලබාගැනීමට ස්ථානික නියැදිකරණය (in-situ sampling) භාවිත කෙරිණි. අදාල ස්ථානයේ වපසරිය නිර්ණය කරනු ලැබුවේ මානවකෘති මතුපිට විසිරීමේ ව්‍යාප්තිය පදනම් කොට ගෙන ය. ඓතිහාසික ගොඩනැගිලි සහ පුරාණ ගුහාවාසස්ථාන වැනි නිදහස්ව පවතින ස්ථාවර ආකෘති සම්බන්ධයෙන් කටයුතු කිරීමේ

දී පරිමාණගත සිතියම්කරණය සහ ඡායාරූපගත කිරීම ආදි වූ විස්තරාත්මක වාර්තාගත කිරීම් ක්‍රම භාවිත කෙරිණි. විමර්ශනයට ලක් කළ බොහෝ ගුහාවල සෙල්ලිපි පැවති අතර ඇතැම් ඒවා කොටා තිබුනේ ළඟා වීමට අපහසු ගුහා පියැසිවල මුදුන් කෙළවරවල ය. උදාහරණයක් වශයෙන් කිරිමකුල්ගොල්ලට නැගෙනහිරින් ඇති ටැම්කැටියේ පිහිටා තිබෙන එක් ලෙනක වූ ලිපිය කොටා ඇත්තේ බිම් මට්ටමේ සිට මීටර් 25 ක් තරම් උසකිනි. මෙහි ස්පර්ශලාංඡන සටහන් ගැනීමට පුරා දින හතරක කාලයක් වෙහෙසීමට සිදුවිය (බලන්න පහත 7.1.7 කොටස).

පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති තැන්වල ස්ථානීය පිහිටීම GPS තාක්ෂණය ආධාරයෙන් වාර්තාගත කළ අතර එම දත්ත Arcview මෘදුකාංගය හරහා GIS පද්ධතිය භාවිතා කර පරිමාණගත සිතියම්වලට පරිවර්තනය කෙරිණි. භික්ෂූන්වහන්සේලා වාසය කළ ස්වාභාවික ගුහා වාසස්ථාන නිරීක්ෂණය කරන ලද කඳු බෑවුමේ විවිධ උස මට්ටම්වලින් පිහිටා ඇති බව දක්නට ලැබිණි. එහෙත් ඇතැම් ගුහා වාසය කිරීම සඳහා භාවිත කර නොතිබුණි. මෙම වරණීය වාසයට හේතු අවබෝධ කර ගැනීම සඳහා සෑම ගුහාවක්ම පිහිටි මධ්‍යන්‍ය මුහුදු මට්ටම් උස පීඩනමානයක් (*model*. Sunho) භාවිතා කොට ගණනය කිරීමෙන් අනතුරුව එහි උස් මට්ටම්වල ව්‍යාප්තිය සිතියම්ගත කෙරිණි.


## 6. පුරාවිද්‍යාත්මක ස්ථාන

6.1 ස්ථාන අංක 1- ගල්ටැම්යාය ස්තූපය
(රූපසටහන 1; සැලසුම 2)
ස්ථානීය පිහිටීම - 6 38 05.4/80 51 45.1

ගල්ටැම්යාය යනු කුරගල පර්වත උතික්ෂිප්තයේ පාදාන්තයේ පිහිටි නටබුන් ගොඩනැගිලි සමූහයකින් යුත් පුරාණ බෞද්ධ ආරාම සංකීර්ණයකි. ආරාම සංකීර්ණයේ බටහිර කොටසේ පිහිටා ඇති කුඩා ස්තූපය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් කැණීම් කොට මේ වන විට අවම වශයෙන් සංරක්ෂණය කර ඇත. ස්තූපයේ පාදමේ විශ්කම්භය මීටර් 8ක් පමණ වේ (සංරක්ෂණය කිරීමෙන් අනතුරුව).



*ඡායාරූපය අංක 2. ගල්ටැම්යාය බෞද්ධ ආරාමික සංකීර්ණයේ ඇති නටබුන් ගොඩනැගිල්ලක්. මෙය බොහෝ විට පිළිම ගෙයක් විය හැකි ය (ඡායාරූපය. දිනේෂ් දේවගේ).*




*අංක 1. කුරගල කන්දේ උතුරු බෑවුමෙන් සොයාගත් ශිලාමෙවලම්වලින් කිහිපයක් (තිරිවාණා)*

## 6.2 කුරගල

කුරගල යනු මුහුදු මට්ටමේ සිට මීටර් 360ක දක්වා උස්ව නැගුනු පාෂාණ උතික්ෂිප්තයකි. එය ප්ලයිස්ටොසීන යුගයේ අවසානයේ සිටම මානව ජනාවාසය සඳහා කේන්ද්‍රීය ස්ථානයක් වූ බව හඳුනාගෙන ඇත. 1932 වර්ෂයේ දී මෙම ස්ථානය මුලින්ම සී.එච් කොලින්ස් ගේ නිරීක්ෂණයට ලක්වූ අතර ඔහු ඒ පිළිබඳව පහතාකාරයෙන් කෙටි විස්තරයක් කරයි.

................................ කුරගල යනු ..................... අපගේ අවධානය වෙනමම ඇඳ බැඳ තබාගන්නා ස්ථානයකි. මෙහි දී එම අවධානය යොමුවන්නේ කඳු පාදාන්තයට



*ඡායාරූපය අංක 3. කුරගල කන්දේ පර්වත සහිත භූමිදර්ශනය. මෙහි ඇති බොහෝමයක් ගුහා ප්‍රාග්ඓතිහාසික කාලයේ සිට ඓතිහාසික කාලපරිච්ඡේදය දක්වා විවිධ කාලවකවානුවල දී භාවිතා කර ඇත (ඡායාරූපය. අනූෂා වන්නිනායක).*

පමණක් නොව එහි මස්තකය ද පාදාන්තය තරම්ම වැදගත් ය. මෙයට ළඟා විය හැක්කේ බලංගොඩ- කල්තොට මාර්ගයේ කන්ද කල්තොට දක්වා බැවුම් වීමට මත්තෙන් ඒ හරහා වැටී ඇති අඩි පාරකිනි. උස්කඳු මුඳුන් දෙකක් සහ ඒ අතර ඇති ප්‍රපාතාකාර කපොල්ල ප්‍රදේශය පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් ය. කල්තොටට ආසන්න පළමු කොටසේ ගුහා බොහෝමයක් ඇති අතර එහි දී ශිලාලේඛන දෙකක් නිරීක්ෂණය කෙරිණි. හිටුවන්ගල නමින් හඳුන්වන උස් කඳු මුදුනේ අනෙක් සාධක දැක ගත හැකි ය *(JRASCB XXXII (85):166)*.


2012-13 වර්ෂයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කූරගල ගුහා අංක 1 (පහත බලන්න) ඉදිරිපිට ඇති මාලකයේ කළ කැණීමෙන් එම ස්ථානය ප්‍රාග්ඓතිහාසික වාසස්ථානයක් වශයෙන් භාවිතා කළ බව හෙළි කරන සාධක සොයා ගැනිණි. කැණීම් වළෙහි ස්තරායනයෙහි පහලම මට්ටම්වලින් ලබා ගත් විකිරණශීලී දින අදින් වසර 16 000 කට පෙර කාලයකට අයත් බව ගණනය කර ඇත. එයින් සොයාගත් මානව ඇටසැකිල්ල අදින් වසර 8000 ක් පැරණි කාලයකට අයත් බවට දින නිර්ණය කර ඇති බව පැවසේ (*එන්. පෙරේරා සමඟ කළ පෞද්ගලික සංවාදයකිනි*). මෙම ගුහාවේ බිම් මට්ටමේ සිට මීටර් 5.98 ක උසකින් පූර්ව-බ්‍රාහ්මී ශෛලියේ අකුරින් කෙටූ සෙල්ලිපියක් දක්නට ඇත. මෙම ස්ථානයේ දක්නට තිබෙන ප්‍රධානම පුරාවිද්‍යාත්මක නිරූපණය වන්නේ බුදු දහම ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත වූ මුල් කාලවකවානුවේ දී බෞද්ධ සංඝයා වාසය කළ ස්වාභාවික ගුහා සමුච්ඡයයි. මෙම පර්වත උත්ක්ෂිප්තය අවට බෞද්ධ ස්වාමීන්වහන්සේලා විසින් භාවිත කරන ලද ස්වාභාවික ලෙන් වාසස්ථාන දහයක් පමණ පිහිටා ඇත. ඒවායින් සමහරක *බ්‍රාහ්මී* අක්ෂරවල මුල් රූපවලින් යුත් කෙටියෙන් ලියූ සෙල්ලිපි ඇත. මේ සියල්ලකම අන්තර්ගත වන්නේ විවිධ පුද්ගලයන් විසින් බෞද්ධ භික්ෂූන්ට කළ දීමනා පිළිබද තොරතුරු ය. මේ සෑම සෙල්ලිපියක් පිළිබඳ තොරතුරු හා ඒවා අයත් ගුහා පිළිබඳ විස්තර සමඟ පහතින් ඉදිරිපත් කර ඇත. ගුහා පියස්සේ කටාරම් කොටා පැවති එහෙත් සෙල්ලිපි කොටා නොතිබූ ගුහා කිහිපයක් ද හඳුනා ගැනීමට හැකි විය. කූරගල සමස්ත පුරාවිද්‍යාත්මක භූමිදර්ශනයම නූතන ඉදිකිරීම්වලින් ව්‍යාකූලත්වයට පත්ව ඇත. මෙයින් ගුහා අංක 1 (රූප සටහන 4) පිහිටි මළුවේ ඉදිකර ඇති මුස්ලිම් දේවස්ථානය ඒ අතර කැපී පෙනේ. එහි ඇති ඉස්ලාමීය ආගමික ගොඩනැගිල්ල ඉදි කළ වර්ෂය පිළිබඳ හෙළිකරන කෙටි ලිපියට අනුව එහි ඉතිහාසය ක්‍රිස්තු වර්ෂ 1926 වඩා පැරණි නොවේ. එහෙයින් මළුවට

බටහිර කොටසේ ඇති ඉස්ලාමීය බැතිමතුන්ගේ සොහොන් කොත් සමූහය ද දේවස්ථානය ඉදි කළ කාල පරිච්ඡේදයටම අයත් බව නිගමනය කළ හැකි ය.

කුරගල පුරාවිද්‍යා බිමට ළඟාවීමට ඇති ප්‍රධාන පිවිසුම් මාර්ගය දෙපැත්තේම මෑත කාලයේ ඉදි කළ ගොඩනැගිලිවලින් සැලකිය යුතු සංකර ස්වභාවයක් එක් කොට ඇත. මෙම විමර්ශනයේ දී පොළව මතුපිට විසිර තිබූ තිරිවාණා ගලින් කළ ප්‍රාග්ඓතිහාසික ශිලාමෙවලම් කිහිපයක් සහ ඒවා සකස් කළේ යැයි සිතිය හැකි ස්ථාන කිහිපයක් ද හඳුනා ගැනිණි. එහෙයින් කුරගල සහ ඒ අවට භූමිදර්ශනයේ ඇති අන් සෑම කඳු බෑවුකම සහ මුදුනකම හොලෝසීන යුගයේ සිටි දඩකරු- අන්න ගවේෂකයන් විසින් ඔවුන්ට අවශ්‍ය ආහාර සොයා ගැනීම සඳහා නිරන්තරයෙන් ගැවසෙන්නට ඇති බව සිතිය හැකි ය. එහෙයින් අවම වශයෙන් මෙම වාර්තාවට ඇතුළත් කර ඇති ඇති ගවේෂණ සැලසුමේ 'සංවේදී කලාපය' යනුවෙන් නම් කර ඇති කොටසින් පිටත සීමාවට පමණක් මානව මැදිහත් වීම් කිරීම සුදුසු බව මෙයින් වඩාත් අවධාරණය කරමු (බලන්න. සැලසුම-27). මෙම ප්‍රදේශයෙන් මිනිසුන් විසින් කරන ලද ඉදිකිරීම් ඉවත් කළ හොත් එය හොලෝසීන යුගයේ අවසාන කාල පරිච්ඡේදයේ ශ්‍රී ලංකාවේ අපසාමුද්‍රික ප්‍රදේශ අභ්‍යන්තරයේ සිටි දඩකරු-අන්න ගවේෂකයන් ජීවත් වූ සමස්ත භූමි දර්ශනයම අධ්‍යනය කිරීමට අපේක්ෂා කරන අනාගත පර්යේෂකයන්ට සහ ඉතිහාසය හා පුරාවිද්‍යා හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඉතිරි කර දීම සඳහා ගත හැකි වැදගත්ම තීරණයක් වනු ඇත.

6.2.1 ස්ථාන අංක 2-කුරගල ගුහා අංක 1
ස්ථානීය පිහිටීම - 6 37 26.5/80 52 10.8

කුරගල උත්ක්ෂිප්තයේ ශිඛරයේ පිහිටා ඇති මෙම ගල්ගුහාව විශාල ගල් පර්වත කිහිපයක් එකතු වී සකස් වූවකි. පියැසි විවරය නැගෙනහිර දෙසට විවෘත වී ඇත. ගුහා අභ්‍යන්තරය අඳුරු ස්වභාවයෙන් යුක්ත වන අතර දිගුකාලීන වාසය සඳහා වඩා නුසුදුසු බව පෙනේ. මෙම පියැස්සේ කිසිදු කටාරමක් හෝ සෙල්ලිපියක් කොටා නොමැත. ගුහා පිවිසුමේ සිට බලන විට වැලිපොතේයාය තැනිතලාවේ රමණීය භූමිදර්ශනය මැනවින් දැකගත හැකි ය.



*ඡායාරූපය අංක 4. කුරගල ගුහා අංක 1. දරණ ගුහාව ඉදිරියේ තනා ඇති ගොඩනැගිල්ල මුස්ලිම් දේවස්ථානයයි (ඡායාරූපය රාජ් සෝමදේව).*

6.2.2 ස්ථාන අංක 3 - කුරගල ගුහා අංක 2 (රූප සටහන 3)
ස්ථානීය පිහිටීම - 6 37 21.4/80 52 04.4

ඊසාන දිසාවට මුහුණ පා ඇති මෙම ගුහාව නිධන් හොරුන්ගේ ග්‍රහණයට හසු වී ඇති අතර එහි තිබී ශිලාමෙවලම් කිහිපයක් සහ බෙල්ලන්ගේ කවච හා අස්ථි කැබලි කිහිපයක් සොයා ගැනිණි. ගුහාවේ අභ්‍යන්තර අවකාශය මී 6.89 x මී 4.25 ක් පමණ වේ. පියස්සේ උපරිම උස මී 3.30 කි. කටාරමක් හෝ සෙල්ලිපියක් කොටා නොමැත.

6.2.3 ස්ථාන අංක 4 - කුරගල ගුහා අංක 3 (රූප සටහන 4; සැලසුම 2)


ගිණිකොණ දිශාවට මුහුණ පා ඇති මෙය කුරගල සංකීර්ණයේ පිහිටා ඇති විශාලම ගල්ගුහාවලින් එකකි. ගුහාවේ අග්නිදිග අන්තයේ ඉදි කර ඇති නව ගොඩනැගිල්ල මුස්ලිම් දේවස්ථානයයි. ගල්ගුහාවේ නිරිතදිග අන්තයට වන්නට බ්‍රාහ්මී අක්ෂරවලින් යුත් සෙල්ලිපියක් කොටා ඇති අතර එහි ..............දත සමුදහ ලෙණෙ (දත්තගේ සහ සමුද්දගේ..........ලෙන) යනුවෙන් දැක්වේ. (Paranavitana 1970:774; *JRASCB* XXXII:167; *ASCAR* 1961-62:82).

6.2.4 ස්ථාන අංක 5 - කුරගල ගුහා අංක 4 (සැලසුම 3)
ස්ථානීය පිහිටීම- 6 37 37.4/80 52 12.0


තරමක් කුඩා ගුහාවක් වන මෙය ගිණිකොණ දිශාවට මුහුණ පා සිටී. ගුහා පියස්සේ කෙටූ කටාරම මැනවින් දැක ගත හැකි අතර එහි සෙල්ලිපියක් කොටා නැත. ගුහා අභ්‍යන්තරය ඉතා විශාල වශයෙන් මෑතකාලීනව සිදු වූ වෙනස්කම්වලට භාජනය වී ඇති අතර එහි අභ්‍යන්තර අවකාශයේ උපරිම පළල මීටර 3.60 පමණ වේ.

6.2.5 ස්ථාන අංක 6 - කුරගල ගුහා අංක 5 (රූප සටහන 5)
ස්ථානීය පිහිටීම- 6 37 25.3/80 52 12.0

විශාල ගුහාවක් වන මෙය නැගෙනහිර දිශාවට මුහුණ පා සිටී. ගුහා අභ්‍යන්තරයේ ආසන්න දිග මීටර 75ක් පමණ වන අතර කැඩී බිඳී ගිය යන්තමින් නිරාවරණය වූ කුට්ටි ගල් කැබලිවලින් පිරී පවතී. ගැමියන් අතර මෙම ගුහාව *'ලුණුදිය ගල්ගේ'* යන නමින් ප්‍රචලිතව ඇත. පියස්සේ කොටා ඇති කටාරම මැනවින් දර්ශනය වුවත් එහි සෙල්ලිපියක් කොටා පැවති බවට සාධක නැත. ගුහාව පිහිටා ඇත්තේ මීටර 320 ක මධ්‍යන්‍ය මුහුදු මට්ටම් උසකිනි.



*ඡායාරූපය අංක 5. කුරගල කන්දේ පිහිටා ඇති විශාල ගුහාවලින් එකක්. කුරගල වැසියන් මෙම ගුහාව ලුණුගල්ගේ යන අන්වර්ථ නමින් ද හඳුන්වයි (ඡායාරූපය. දිනේෂ් දේවගේ).*




*ඡායාරූපය අංක 6. කුරගල ඇති කටාරම් කෙටූ ගුහාවක් . වර්තමාන නරඹන්නන් විසින් එම ගුහාවලට කරන ලද හානිය මෙම ඡායාරූපයෙන් පැහැදිලි වේ (ඡායාරූපය රාජ් සෝමදේව).*

6.2.6 ස්ථාන අංක 7 - කුරගල ගුහා අංක 6 (සැලසුම 4)
ස්ථානීය පිහිටීම - 6 37 35.2/80 52 06.6

මෙම ගුහාවේ කටාරමක් කොටා තිබුන ද ඊට පහළින් කිසිදු සෙල්ලිපියක් කොටා පැවති බවට සාධක නැත. මෑත කාලයේ මෙයට ආ ගිය පුද්ගලයින් විසින් ගුහා බිත්තියේ නොයෙක් නම් ලියා ඉරි ගසා පාට ගන්වා විකෘති කොට ඇත. ගිනිකොණ දිශාවට මුහුණ ලා ඇති මෙම ගුහාව මීටර 320 ක මධ්‍යන්‍ය මුහුදු මට්ටම් උසකින් පිහිටා ඇත.

6.2.7 ස්ථාන අංක 8 - කුරගල ගුහා අංක 7 (රූප සටහන 6; සැලසුම 5)
ස්ථානීය පිහිටීම - 6 37 34.7/80 52 05.3

මෙම ගුහාව විශාල ගල් කුලක් බිඳී ගොස් ඉන් සකස් වන්නට ඇති බව සිතිය හැකි ය. ගුහා ප්‍රවේශය දකුණු දිශාවට විවෘත වී ඇත. ගුහාව පිහිටා ඇත්තේ මී 310 ක මධ්‍යන්‍ය මුහුදු මට්ටම් උසකිනි. කටාරම් කෙටූ බවට හඳුනාගත හැකි සලකුණු කිසිත් නොමැත. අභ්‍යන්තරයේ පොළව පස් පුරවා මට්ටම් කොට ඇත. ඉහතින් දැක්වූ ගුහා අංක 6 මෙන්ම මෙහි බිත්ති ද මෑතකාලීනව



*ඡායාරූපය අංක 7. පුරාණයේ ගල් වළක් වශයෙන් භාවිත ස්ථානයකි. ගල් මත කළ කුඩා සිදුරු තවමත් පෙනෙන්නට ඇත (ඡායාරූපය. දිනේෂ් දේවගේ).*



*ඡායාරූපය අංක 8. කුරගල ආරාමික සංකීර්ණයේ ඇති ලෙන් සමුච්චයෙහි ස්වාභාවික පිහිටීම (ඡායාරූපය. රාජ් සෝමදේව).*

ආ ගිය වන්දනාකරුවන් විසින් විකෘති කොට ඇත. ගුහා බිත්තියේ හරි මැදට වන්නට විශාල කුහරයක් තිබෙන අතර මෙය ගල්කුල වෙන් වෙද්දී නිර්මාණය වූවක් විය හැකි ය.

6.2.8 ස්ථාන අංක 9 - කුරගල ගුහා අංක 8 (සැලසුම 6)
ස්ථානීය පිහිටීම - 6 37 36.6/80 52 08.0

මෙම ගුහාව මධ්‍යන්‍ය මුහුදු මට්ටමෙන් මීටර 350 ක් උසකින් පිහිටා ඇත. වාසස්ථානයට සුදුසු වුවත් අතීතයේ දී එය භාවිතා කළ බවට කිසිදු සාධකයක් හඳුනාගත නොහැකි ය. ගුහාව නැගෙනහිර දිශාවට මුහුණ ලා සිටී.

6.2.9 ස්ථාන අංක 10 - කුරගල ගුහා අංක 9

ගල්කුළු කිහිපයකින් වට වී ඇති මෙම ගුහාව ඊසාන දිශාවට මුහුණ පා සිටී. ගුහා අභ්‍යන්තරය සැලකිය යුතු ආකාරයකින් පුරවා මට්ටම් කොට ඇත. ගුහාවට ඉදිරියෙන් යොදා ඇති ගල්වැටිය මගින් ගුහාවේ සැබෑ පොළව මට්ටම මීටර කිහිපයකින් උස් කොට මාලකයක් ලෙස සකස් කොට ඇත. ගුහාව තුළ ගිනි දල්වා ඇති අතර ගුහා බිත්තියේ ඇති කලු පැහැ ගැන්වීම මගින් එය තහවුරු කරයි. බිම් මට්ටමේ සිට මීටර 20 ක් පමණ උසකින් කොටා ඇති කටාරම නිරුපද්‍රිතව පවතී. බ්‍රාහ්මී අකුරින් මනාව කෙටූ සෙල්ලිපියක් කටාරමට පහළින් දක්නට ඇත (පහත 7 කොටස බලන්න). එහි ස්වාභාවික පිහිටීම නිසා ගුහාව අවට චමත්කාරජනක පරිසරය මැනවින් දර්ශනය වේ.

6.2.10 ස්ථාන අංක 11 - කුරගල ගුහා අංක 10 (රූප සටහන 8; සැලසුම 7)
ස්ථානීය පිහිටීම - 6 37 39.8/80 52 07.6

මෙම ගුහාවේ පියස්සේ කටාරම් දෙකක් කොටා ඇති අතර ඉන් එකක් රළු ස්වාභාවයෙන් යුක්ත ය. කටාරම කෙටීමෙන් පසු එය සුමට කිරීමට උත්සාහයක් ගෙන නොමැති බව පෙනේ. කෙසේ හෝ ඊට තරමක් යටින් කොටා ඇති කටාරම මනාව සකස් කර සුමට කළ බවට සාධක පවතී. මේ පිළිබඳ වැඩිදුරටත් කළ නිරීක්ෂණවලින් මෙම කටාරම් කාලපරිච්ඡේද දෙකක දී කළ ඒවා බව නිගමනය කළ හැකි බව තහවුරු විය. එහෙයින් සමහර විටක ඉහලින් ඇති කටාරම මෙම ගුහාව වාසස්ථානයක් වශයෙන් භාවිත

කළ මුල් කාලපරිච්ඡේදයක දී කෙටුවක් බව සිතීම ඥානාන්විතය. දෙවෙනි කටාරමෙන් එකී කාර්යයෙහි නිපුණත්වයට පත්වීමක් එනම් ගල් වැඩවල දී යොදාගත් තාක්ෂණයේ යම් දියුණු අවස්ථාවක් පෙන්නුම් කරයි. කටාරමට යටින් කෙටූ සෙල්ලිපියක් දැක ගත නොහැකි අතර මෙය මධ්‍යන්‍ය මුහුදු මට්ටමින් මීටර 360 ක් උසකින් පිහිටා ඇත.

6.3 - ස්ථාන අංක 12 - කුම්භීය නිඛනනයක්
ස්ථානීය පිහිටීම- 6 37 55.9/80 51 55.6

මෙය *තන්ජන්තැන්නේ ගෝනගල* නමින් හඳුන්වන ගමේ වී.වී විජේවර්ධන මහතාට අයත් වගා ඉඩමේ පිහිටා ඇත. භූමිය මතුපිට කළ නිරීක්ෂණවලින් පුරාණ වළංකැබලිති විශාල ප්‍රමාණයක් ඒ අවට විසිර පවතින බව පැහැදිලි විය. පුරාණ පබළු කිසිම් ප්‍රමාණයක් ද මතුපිට විසිර තිබූ බව ඉඩම් හිමිකරු විසින් අනාවරණය කෙරිණි. භූමිය සකසන අවස්ථාවක දී පොළව තුළ වළලා තිබූ මැටි මුට්ටියක් ද ඔහුට හමු වී තිබිණි. මෙය පූර්ව ඓතිහාසික යුගයේ අගභාග යේදී හෝ මුල්ඓතිහාසික යුගයේ මුල් අවධියේදී කළ භස්මාවශේෂ වැළලීමක් වීමට බොහෝදුරට ඉඩ තිබේ.

6.4 ස්ථාන අංක 13 -ගල කොටා සකස් කළ පඩි පෙළ
ස්ථානීය පිහිටීම - 6 37 52.2/80 51 55.9


පොළව මට්ටමෙන් ඉහළට මනාව මතුව ඇති මෙම ගල්කුළෙහි මතුපිට පෘෂ්ටය හාරා උතුරු සහ දකුණු අක්ෂගතව පඩි තුනක් සකස් කර ඇත (පළල මීටර 0.86). මෙයින් ගම්‍ය වන්නේ මේ හරහා පුරාණ මාර්ගයක් වැටී පැවති බවයි. සමහර විටෙක කුරගල උතික්ෂිප්තයේ ඉහළ මට්ටම්වල පිහිටා ඇති ගුහා සඳහා ප්‍රවේශ වීමට භාවිතා කළ පැරණි මාර්ගය වන්නට ද ඉඩ ඇත.

6.5 ස්ථාන අංක 14 -ගල් ආකරය (රූපසටහන 7)
ස්ථානීය පිහිටීම- 6 38 04.4/80 51 56.5

මතුපිට පෘෂ්ටයේ එක පෙළට කළ කුඩා කුහර සහිත විශාල ගලක් මෙම ස්ථානයේ පිහිටා ඇත. මේවා පුරාණයේ දී ආරාම ඉදිකිරීම සඳහා ගල්පුවරු ගලවා ගැනීම සඳහා ගල මත කළ පැලුම් විවරය සකස් කිරීමට යෙදූ කුහර වශයෙන් හඳුනා ගත හැකිය. මේ වන විට මෙම ස්ථානය ගෝනගල ගම්වැසියෙකුට අයත් අතර එහි ඔහු විසින් තේක්ක වගාවක් සිදු කර තිබේ.



*ඡායාරූපය අංක 9. කල්තොට පබ්බතාරාමයේ පිහිටා ඇති ගුහාවක්. මෙහි ඇති බොහෝමයක් ගුහා නූතනයේ දී විශාල වශයෙන් වෙනස්කිරීම්වලට ලක් කර ඇති අතර මෙම ගුහාව ඉදිරියේ ඇති ගරාවැටුණු මඩුව එලෙස ඉදි කර ඇති වැසිකිලියකි (ඡායාරූපය. රාජ් සෝමදේව).*



*ඡායාරූපය අංක 10. පබ්බතාරාමයේ පිහිටා ඇති ලෙන් ආවාසයක් (ඡායාරූපය. රාජ් සෝමදේව)*

6.6 ස්ථාන අංක 15 - තවත් ගල් ආකරයක්
ස්ථානීය පිහිටීම - 6 38 13.8/80 52 13.0

ගෝනගල ගමේ පිහිටා ඇති තවත් ස්වාභාවික පාෂාණ සැකැස්මක් වන මෙහි රළුව සකස් කළ ගල්ටැම් කිහිපයක් විසිර පවතී. ඇතැම් ගල්කුළු මත එක පෙළට විද ඇති කුහරවලින් මෙම ස්ථානය අතීතයේ දී ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ගල් ලබා ගත් ස්ථානයක් වශයෙන් භාවිතා කළ බව නිගමනය කළ හැකි ය. නුදුරෙන් ඇති *ගල්ටැම්යාය* නම් පුරාණ බෞද්ධ ආරාම සංකීර්ණය ඉදිකිරීම සඳහා අවශ්‍ය ගල් කුළුණු මෙම ස්ථානයෙන් ලබාගන්නට ඇති බව සිතීම වඩාත් සාධාරණ ය. එය එසේ නම් මෙම ගල් වළ ක්‍රිස්තු වර්ෂයෙන් හත්වන සියවසේ දී පමණ භාවිත වූවක් බවට සැකයක් නැත.

## 6.7 පබ්බතාරාමය

මෙම ගවේෂණයේ දී වැලිපොතේයාය ගමේ පිහිටි ලෙන් සංකීර්ණයක් ද නිරීක්ෂණය කෙරිණි. එම ස්ථානය වර්ථමානයේ හැඳින්වෙන්නේ පබ්බතාරාමය නමිනි. එය ද තවත් පුරාණ ආරාමික ලෙන් සංකීර්ණයක් ලෙස නැතිනම් බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ආවාස වශයෙන් භාවිතා කළ බවට සාධක පවතී. මේ අතරින් ඇතැම් ලෙන්වල එකල වාසය කළ බැතිමතුන් විසින් සංඝයාට එම ලෙන් පූජා කළ බව පැහැදිළි කරන සෙල්ලිපි කිහිපයක් ද කොටා තිබේ.

6.7.1 ස්ථාන අංක 16 - පබ්බතාරාමය ගුහා අංක 1 (රූප සටහන 12; සැලසුම 8)
ස්ථානීය පිහිටීම - 6 37 29.0/80 52 32.0

මෙය තරමක විශාල ගුහාවකි. කටාරමක් කොටා ඇති මෙහි ඊට යටින් බ්‍රාහ්මී අකුරින් කළ සෙල්ලිපියකි (7.1.11 කොටස බලන්න). මෙම සෙල්ලිපිය කොටා ඇත්තේ ගුහා පියස්සේ දකුණු පසට වන්නට ය. නොබෝ කාලයකට පෙර ගම්වැසියන් විසින් භික්ෂූන්වහන්සේ කෙනෙකුගේ වාසස්ථනය සඳහා මෙම ස්ථානයේ ආවාසයක් ඉදි කර ඇත.

6.7.2 ස්ථාන අංක 17- පබ්බතාරාමය ගුහා අංක 2 (රූපසටහන 9)
ස්ථානීය පිහිටීම- 6 37 26.2/80 52 31.0

මෙම ස්ථානයේ ඉහළ මට්ටමක පිහිටා තිබෙන බෙහෙවින් වෙනස්කිරීම්වලට ලක් කරන ලද තවත් එක් ස්වාභාවික ගුහාවක් නිරීක්ෂණය කෙරිණි. එහි කටාරමක් කොටා තිබුණ ද කිසිදු සෙල්ලිපියක් දැක ගත නොහැකි ය. මෑතකාලයේ

භාවනා කටයුතු කිරීම සඳහා මෙම ගුහාව තුළ ගඩොලින් කළ කුටියක් ඉදිකර ඇත. අවට භූමි දර්ශනයට වඩාත් බාධාකාරී දෙය නම් ගුහාවට ඉදිරියෙන්ම ඉදි කර ඇති වැසිකිලියයි. භාවනා කිරීම සඳහා මෙහි පැමිණෙන්නෙකුට ගුහාවේ පවතින මෙම ව්‍යාකූල පරිසරය මැද තම සිත එකඟ කරගත හැක්කේ කෙසේ ද යන්න සිතා ගන්නටත් අපහසු කරුණකි.

6.7.3 ස්ථාන අංක 18 - පබ්බතාරාමය ගුහා අංක 3 (රූපසටහන 10; සැලසුම 10)
ස්ථානීය පිහිටීම- 6 37 29.2/80 52 28.2

දැනට බුදුමැදුරක් බවට පත් කර ඇති මෙම ගුහාවේ, පියස්සේ කටාරමක් සහ කෙටි සෙල්ලිපියක් කොටා ඇත (බලන්න කොටස 7.1.10). ගුහාවේ දකුණු දෙසට වන්නට ගඩොලින් කළ පුරාණ බිත්තියකට අයත් අවශේෂ කොටස් දැක ගත හැකි ය. මේවා දහනමවන ශතවර්ෂයේ දී ඉදිකරන්නට ඇතැයි සිතිය හැකි බුදුමැදුරකට අයත් බිත්තියක කොටස් විය හැකි බව අනුමාන කිරීම සාධාරණ බව පෙනේ.

6.7. ස්ථාන අංක 19 - පබ්බතාරාමය ගුහා අංක 4 (රූප සටහන; සැලසුම 11)
ස්ථානීය පිහිටීම - 6 37 27/80 52 22


මෙම භූමියේ ම ඉහළ මට්ටමක පිහිටා ඇති තවත් එක් ගුහාවකි. ගුහා පියස්සේ උපරිම උස බිම් මට්ටමේ සිට මීටර 5.50 ක් පමණ වේ. කටාරමක් සහ එයට යටින් කෙටූ සෙල්ලිපියක් දැකගත හැකි ය. ගුහාවට අල්ලා තාවකාලික මඩුවක් තනා ඇත.

6.8 ස්ථාන අංක 20 - විල්ආර ගුහාව (රූප සටහන 20)
ස්ථානීය පිහිටීම- 6 36 41 7/80 51 58.6

කල්තොටින් කිලෝමීටර් කිහිපයක් බටහිරින් ඇති විල්ආර යනුවෙන් හැඳින්වෙන ග්‍රාමයේ පිහිටි ස්වාභාවික ගුහාවක් නිරීක්ෂණය කෙරිණි. මෙය කඳු බෑවුමක පිහිටා ඇත. ගුහා පියස්සේ එතරම් උස නොවීමට හේතුව වන්නට ඇත්තේ ඛාදනයට ලක් වූ කන්දෙන් පහළට පෙරලී ආ පස් ගුහාව තුළ තැන්පත් වීම නිසා ය. කටාරම් කොටා තිබීමෙන් අතීතයේ දී මෙය වාසස්ථානයක් වශයෙන් භාවිතා කළ බව තහවුරු වේ. ගුහාවේ සෙල්ලිපියක් කොටා නැත.

6.9.1 ස්ථාන අංක 21 - ඉද්දගල වැව
ස්ථානීය පිහිටීම - 6 37 50.5/80 50 51.1

තන්ජන්තැන්න නමින් හැඳින්වෙන ගමේ පිහිටා ඇති මෙම ජලාශය වර්ෂා ජලයෙන් පෝෂණය වන, මිනිසුන් විසින් සෑදූ විශාල වැවකි. වැව්



*ඡායාරූපය අංක 11. පබ්බතාරාමයේ පර්වත සහිත භූමිදර්ශනයේ ඇති ස්වාභාවිකව පිහිටි ගුහාවක්. මෙම ගුහාවේ සෙල්ලිපියක් කොටා ඇත (ඡායාරූපය රාජ් සෝමදේව).*



*ඡායාරූපය අංක 12. කල්තොට පබ්බතාරාමයේ ඇති තවත් ස්වාභාවිකව පිහිටි ගුහාවක්. මෙම ගුහාව ඉදිරියේ ඇත්තේ භික්ෂූන්වහන්සේලාට වාසය සඳහා ඉදි කරන ආවාසයේ ගල් අතුරා සැකසූ පාදමයි (ඡායාරූපය. රාජ් සෝමදේව).*

බැම්ම උතුරට දිශානුගත ය. මෑතකාලයේ දී මෙම පුරාණ ජලාශය ප්‍රතිසංස්කරණයට ලක් කර ඇත. මෙම හේතුව නිසා අවට පරිසරය සැලකිය යුතු ආකාරයෙන් වෙනස්කම්වලට ද බඳුන් වී ඇත. නිරීක්ෂණයට ලක්වන මොහොතේ දී ජලාශය සිඳී පැවතිණි.

6.9.2 ස්ථාන අංක 22 - ඉද්දගල පුරාණ ජනාවාසය
ස්ථානීය පිහිටීම - 6 37 58.3/80 50 24.4

ඉද්දගල වැවට නුදුරින් විශාල ඝනත්වයකින් යුක්තව පුරාණ වළංකටු කැබලිති විසිරුණු ස්ථානයක් නිරීක්ෂණය කෙරිණි. මෙම ගොඩැල්ල මීටර 100 x 80 ත් අතර ප්‍රදේශයක ව්‍යාප්තව ඇත. හමු වූ පුරාවස්තු අතර කාල-රක්ත මැටි වළං (BRW) කැබලි ප්‍රධාන වූ අතර එමඟින් පුරාණ කාලයේ එතැන පැවති ජනාවාසයේ පෞරාණිකත්වය පිළිබඳ අදහසක් ලබා ගත හැකි විය. ඉද්දගල වැව භාවිතා කළ පුරාණ ජනයා මෙම ගොඩැල්ල ජනාවාස කොට වෙසෙන්නට ඇත.

6.9.3 ස්ථාන අංක 23 - ඇඳගල පුරාණ මාලකය
ස්ථානීය පිහිටීම - 6 37 59.1/80 50 10.4

මෙය ඉද්දගල කළෑ බද ප්‍රදේශය තුළ ඇති වැටි යොදා සකස් කළ මාලකයකි. රළු ගල්කුට්ටි යොදා ගෙන මළුව ආරක්ෂා වන පරිදි මෙම වැටිය සකස් කර ඇත. දැනට මතුවී පෙනෙන්නේ බිත්තියෙන් කොටසක් වන අතර ඉතිරිය භූමියේ ඉහළ සිට උතුරු දිශානුගතව සිදු වී ඇති ඛාදනය හේතුකොට ගෙන සෝදාගෙන ආ පස්වලින් වැසී ඇත. එහෙයින් මෙම මාලකයේ වපසරියේ විහිදීම ගණනය කරන්නට සිදු වූයේ මෙම පස් වැස්මත් සමඟ ය. එය ඉතා රළු ගණනය කිරීමක් නිසා මෙහි සඳහන් කිරීමට තරම් සුදුසු නොවේ. මෙහි කළ ඉදිකිරීමක් පිළිබඳ කිසිදු සාධකයක් දැක ගැනීමට නොහැකි ය.

6.9.4 ස්ථාන අංක 24 - ඇඳගල නටබුන්
(රූප සටහන 13; සැලසුම 13)
ස්ථානීය පිහිටීම- 6 38 02.7/80 50 15.2

මෙම ස්ථානයේ පුරාණ ගොඩනැගිල්ලකට අයත් නටබුන් ශේෂ වී ඇත. නිරීක්ෂණය කරන ලද ප්‍රධාන ඉදිකිරීම ස්වභාවික පර්වතයක් මට්ටම් කොට ඒ මත ඉදි කර ඇත. මෙම ගල මත පුරාණ ගොඩනැගිල්ලක් ඉදි කර ඇති බවට බොහෝ සාධක පවතින අතර ඒ මත දැකගත හැකි, ගල මතුපිට හාරා සකස් කළ කණු වළවල් සහ මන්ද-

උන්නත සඳකඩපහණ මගින් මෙය වඩාත් පැහැදිලි වේ. මෙම සඳකඩපහණින් එහි කුටියකට ප්‍රවේශ වීම සඳහා යොදා පැවති බවට සංඥාර්ථයක් සපයයි. පර්වතයේ උතුරු දිශාවෙන් ගල හාරා සකස් කළ ගල් පඩිපෙළකි. උතුරු දිශානුගතව එකිනෙකට සමාන්තරව විහිදෙන ගල්කණු පේලි දෙකකි. මෙම ගොඩනැගිල්ල යම් ආගමික කටයුත්තක සඳහා භාවිතා කරන්නට ඇත. එහෙත් මෙම ගොඩනැගිල්ල බෞද්ධ ආගමික කටයුත්තක් සඳහා භාවිතා වූ ව්‍යුහයක් බවට අනුමාන කළ හැකිය යන මතයට සහය දක්වන කිසිදු ප්‍රබල සාධකයක් දක්නට නැත.

6.10 ස්ථාන අංක 25 - යබොර ගොඩැල්ල
ස්ථානීය පිහිටීම - 6 38 00.5/80 50 59.8

ඉද්දගල ජලාශයට ආසන්නයේ යබොර කොටස් විසිර පැවති ගොඩැල්ලක් හඳුනා ගැනිණි. භූමියේ මතුපිටින් පුරාණයේ යකඩ උණු කළ උඳුනක කොටස් කිහිපයක් හා උඳුන සඳහා වාතය ලබා දීමට සකස් කළ මැටි නළයක් යන දෑ සොයා ගැනුණි. භූමිය මත පුරාවස්තුවල දළ පැතිරීම මීටර 80 x 75 ක ප්‍රමාණයෙන් යුක්ත ය.

6.11 ස්ථාන අංක -26 - තිරිවාණා මෙවලම් පැතිර පැවති ප්‍රදේශය
ස්ථානීය පිහිටීම- 6 37 38.0/80 51 57.5


මෙය භූමිය මතුපිට ප්‍රාග්ඓතිහාසික ගල්මෙවලම් (තිරිවාණා) විසිර පවතින ස්ථානයකි. දැනට ඉතිරි වී ඇති සුන්බුන් වූ තිරිවාණා කැබලි තොගයෙන් එය ප්‍රාග්ඓතිහාසික සමයේ දී ගල්මෙවලම් තැනූ ස්ථානයක් බව නිගමනය කළ හැකි ය. මතුපිට විසිරුමේ වපසරිය මීටර 100 x 70 ක් පමණ වේ.

6.12 ස්ථාන අංක 27 - බෝ මළුකන්ද
ස්ථානීය පිහිටීම - 6 37 54.0/80 51 16.5

මෙම ස්ථානයේ දී වඩා උස් නොවූ, යබොර විසිර ඇති ගොඩැල්ලක් නිරීක්ෂණයට ලක් කෙරිණි. භූමිය කෘෂිකාර්මික කටයුතුවලට යොදා ගැනීම නිසා එහි මතුපිට ස්වභාවය බෙහෙවින්ම වෙනස් වී ඇත. අතීතයේ දී මෙහි යකඩ උණු කිරීම් කටයුතු සිදු කරන්නට ඇති බව අනුමාන වශයෙන් සිතිය හැකි ය. ස්ථානීය පෞරාණිකත්වය පිළිබඳ තාවකාලික හෝ අදහසක් ලබා ගැනීමට ඉවහල් වන කිසිදු සාධකයක් එහි ඉතිරි වී නොමැත.



*ඡායාරූපය අංක 13. ඇඳගල ඇති ගල් පර්වතයක් සාරා සකස් කළ වාස්තු විද්‍යාත්මක අංග. මෙහි ඇති ගල සාරා සකස් කරන ලද කණු වලවල් මගින් එහි තිබූ ගොඩනැගිල්ල ලී කුළුණු යොදා සකස් කළ බව පැහැදිලි වේ (ඡායාරූපය කුංචන මාතොටආරච්චි).*



*ඡායාරූපය අංක 14. දියඉන්නේ පිහිටි ගල්ගුහාව. මෙහි 1950 දශකයේ දී පී. ඊ . පී. දැරණියගල මහතා විසින් කැනීම් කටයුතු සිදු කර ඇත (ඡායාරූපය. රාජ් සෝමදේව).*

6.13 ස්ථාන අංක 28 - උල්ගල ගුහාව (රූපසටහන 14; සැලසුම 14)
ස්ථානීය පිහිටීම - 6 05 36.5/80 49 55.4

මෙය ගවේෂණයට ලක් කරන ලද කඳුවැටියේ දකුණු බෑවුමේ පිහිටා ඇති විශාල ගුහාවකි. මෙය උඩුපියන් ගල්ගේ යන නමින් ද ප්‍රචලිත ය. උතුරු දකුණු අක්ෂගතව පිහිටා ඇති මෙම ගුහාවට ප්‍රවේශ විය හැක්කේ දකුණු දිශාවෙනි. ගල් පියස්සේ කෙටූ කටාරම තවමත් නිරුපද්‍රිත ය. මෙහි ඇති සෙල්ලිපිය ශ්‍රී ලංකාවේ මූල්ඓතිහාසික කාලපරිච්ඡේදයේ දී අනුගමනය කළ සාමාන්‍ය ක්‍රමය වූ කටාරමට පහළින් නොයොදා ගුහා බිත්තියෙහි කොටා ඇත. සෙල්ලිපිය තනි පේලියකට දක්වා ඇත (බලන්න පහත 7 කොටස). 1950 දශකයේ දී ගුහාවේ වම් කොටස ආචාර්ය පී.ඊ.පී දැරණියගල විසින් කැණීමට ලක් කළ අතර ඒ පිළිබඳ ඔහු මෙසේ අදහස් දක්වයි.

................ 'අර්ධ චන්ද්‍රාකාර කුඩා ශිලාමෙවලම් සහ අත්ගල් පැවතීමෙන් මෙහි නියොලිතික සංස්කෘතියක් බවට සංක්‍රාන්ත්‍රිය ලද මෙසොලිතික සංස්කෘතියක් පැවති බව හෙළි කරයි' (1958:246)

6.14 ස්ථාන අංක 29 - කිරිමකුල්ගොල්ලේ ඇති පුරාණ වැව
ස්ථානීය පිහිටීම -6 35 06.7/80 50 26.0

මෙය කිරිමකුල්ගොල්ල ග්‍රාමයේ පී. ජී. ප්‍රේමදාස මහතාට අයත් ගෙවත්තේ ඇති දිගට විහිදෙන පස් ගොඩැල්ලකි. මෙය පුරාණ වැවකට අයත් වැව්කණ්ඩියක් බව අනුමාන කළ හැකි ය. ජලය පිරෙන ප්‍රදේශය මේ වන විට සම්පූර්ණයෙන් ලඳු කැලෑවලින් වැසී ගොසිනි. අවට කිසිඳු පෝෂක ජල මූලාශ්‍රයක් දැක ගත නොහැකි විය. ඇතැම් විට මෙයට ඉහළින් ඇති කඳුකරයෙන් කාන්දු වන ජලය අතීතයේ දී මෙහි ප්‍රධාන ජල මූලාශ්‍රය වූවා විය හැකි ය.

## 6.15 කිරිමකුල්ගොල්ල

කිරිමකුල්ගොල්ල යනු කල්තොට ප්‍රදේශයේ දියවින්න සහ කළුපේඩිගම දෙගම්මැද්දේ පිහිටි ගමකි. මෙම ගම එයට උතුරුදිග අන්තයෙන් පිහිටා ඇති කඳු වළල්ලෙන් සීමා වී ඇත. මෙම කඳුවැටියේ දකුණු බෑවුමේ ස්වාභාවික ගුහා බොහෝ ප්‍රමාණයක් පිහිටා ඇති අතර ඇතැම් ඒවා බොහෝ ඈත කාලයක සිට මිනිසුන් සිය වාසස්ථාන වශයෙන් භාවිතා කර ඇත. එවැනි ගුහා


බොහෝමයකම ඇති කටාරම් සහ සෙල්ලිපිවලින් ක්‍රිස්තු පූර්ව පළමු සහස්‍රක වර්ෂයේ පසු දශකවල සිටම ඒවා බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ වාසස්ථාන වශයෙන් භාවිත කළ බව තහවුරු වේ. කිරිමකුල්ගොල්ලේ සහ එහි අවට පුරාවිද්‍යාත්මක විමර්ශනයක් ප්‍රථමයෙන්ම සිදු කර තිබෙන්නේ 1939 වර්ෂයේ දීය. ඒ පී.ඊ.පී දැරණියගල විසින් දියවින්න උඩුපියන් ගල්ගේ (වැඩිදුර විස්තර සඳහා 6.13 කොටස බලන්න) කළ කැණීමත් සමඟ වන අතර එහි දී ප්‍රාග්ඓතිහාසික යුගයට අයත් සාධක මතු කර ගන්නා ලදී (Deraniyagala 1939). එම වර්ෂයේදීම කොලින්ස් විසින් කල්තොට ප්‍රදේශයේ කළ විමර්ශනයෙන් අනතුරුව කිරිමකුල්ගොල්ලේ ඇති සෙල්ලිපි පිළිබඳ වාර්තා කර ඇත (Collins 1939). 1952 වර්ෂයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මෙහි ඇති සෙල්ලිපි පිළිබඳ විමර්ශනය කළේ ය (*ASCAR* 1952, appendix II, 18-19). කිරිමකුල්ගොල්ලේ ඇති සෙල්ලිපිවලින් දෙකක් දැනටමත් ප්‍රකාශයට පත් වී ඇත (Paranavitana 1970: 768-9).

6.15.1 ස්ථාන අංක 30 - ගුහා අංක1 (සැලසුම 15)
ස්ථානීය පිහිටීම- 6 35 19.3/80 50 24.2

මෙය කටාරමක් සහිත ගුහාවකි. කටාරමට යටින් සෙල්ලිපියක් කොටා ඇත. ගුහාව බෙහෙවින් වෙනස් කිරීම්වලට ලක් කර ඇති අතර මේ වන විට භික්ෂූන්වහන්සේ නමක් එහි තැනූ කුටියේ වැඩ වාසය කරති.

6.15.2 ස්ථාන අංක 31 - ගුහා අංක 2 ( රූප සටහන 15; සැලසුම 16)
ස්ථානීය පිහිටීම- 6 35 13.7/80 50 28.0

මෙය කටාරමක් සහිත ගුහාවකි. ගුහා පියස්සේ සෙල්ලිපියක් කොටා නැත. ගුහා පියස්ස මෙන්ම එහි බිත්ති කෙළවරවල් දීර්ඝ කාලයක් තිස්සේ ස්වභාවික ඛාදනයට ලක්වීම නිසා බෙහෙවින් දුර්වල වී ඇත. කටාරමෙන් පහළ ඇති සුමට ලෙස සකස් කළ මතුපිට අනෙක් ගුහාවල ද දැකගත හැකි පොදු ලක්ෂණයක් වුවත් මෙම ගුහාවේ තත්ත්වය වෙනස් ය. මෙම ගුහාවේ සිදු වී ඇති රූපවිද්‍යාත්මක වෙනස්කම් (ඛාදන මට්ටම, කටාරමේ පිළිවෙල් සහගත බව යනා දී ) වෙත අවධානය යොමු කිරීමේ දී මෙම ප්‍රදේශයේ වාසය කළ බෞද්ධ භික්ෂූන්වහන්සේලා විසින් නේවාසික අවශ්‍යතා සඳහා භාවිත කළ වඩා පැරණිම අවකාශ මේවා විය හැකිය යන සිතුවිල්ල තවත් බලවත් කරයි. මෙහි සෙල්ලිපියක් කොටා නොතිබීම යන කාරණය හා එකී භාවිතාව ශ්‍රී ලංකාව තුළ ප්‍රචලිත වූ ක්‍රිස්තු පූර්ව 250 කාලපරිච්ඡේදය හා සසඳා බලන විට ද එම



*ඡායාරූපය අංක 15. මෙය කිරිමකුල්ගොල්ලේ පිහිටා ඇති ගුහාවකි. කටාරම් කඩා වැටී පැවතීම එහි පෞරාණිකත්වය නිදර්ශනය කරයි (ඡායාරූපය. දිනේෂ් දේවගේ).*



ඡායාරූපය අංක 16. කල්තොට පුහුල්යාය සුදර්ශනාරාමයේ පිහිටි ලෙනෙහි ඇති කටාරම (ඡායාරූපය. රාජ් සෝමදේව).

කාරණය මෙහි පෞරාණිකත්වය තහවුරු කිරීමට උපකාරි වන අනුපූරක ගතිලක්ෂණයක් වශයෙන් සැලකිය හැකි ය.

6.15.3 ස්ථාන අංක 32 - ගුහා අංක 3
(රූපසටහන 16; සැලසුම 17)
ස්ථානීය පිහිටීම- 6 35 06.5/80 51 02.6

මෙම ලෙන කල්තොට සිට රජවක හරහා බලංගොඩ දක්වා වැටී ඇති ප්‍රධාන මාර්ගයේ ඉදිරියට යද්දී හමුවන පුහුල්යාය ගමේ මාර්ගයෙන් දකුණු අත පැත්තට දිවෙන කුඩා අතුරුමාර්ගය කෙළවරේ තිබෙන ශ්‍රී සුදර්ශනාරාමය නම් විහාර භූමියේ පිහිටා ඇත. දකුණු දිශාවට විවෘත වන ලෙන් පියස්සේ ඇති කටාරම නිරුපද්‍රිත ය. කටාරමට පහලින් බ්‍රාහ්මී අකුරෙන් සෙල්ලිපියක් කොටා ඇති අතර එහි ආරම්භක අකුරු බොහෝමයක් මෑතක දී ගුහාවට අල්ලා ඉදි කරන ලද විහාරයේ වහලට වැසී ඇත. ලෙනෙහි පෙනුමට මෙමගින් සැලකිය යුතු ලෙස බාධා වී ඇත.

6.15.4 ස්ථාන අංක 33 - ගුහා අංක 4
(රූපසටහන 17; සැලසුම 18)
ස්ථානීය පිහිටීම- 6 35 08.0/80 51 10.4

මෙය එහි ඇති තවත් එක් ලෙන් විහාරයක් වන අතර පුහුල්යාය ගමේ පහළ සමෝච්ච රේඛා මට්ටමක පිහිටා ඇත. දකුණු දිශාවට මුහුණ ලා ඇති මෙම ලෙනෙහි පියස්සේ කටාරමක් ද ඉන් පහළ සෙල් ලිපියක් ද කොටා ඇත. පසු කාලපරිච්ඡේදවල දී ද මෙම ලෙන භාවිතයට ගැනුන බවට සාධක පෙනෙන්නට ඇත. වර්ෂා ජලය ලෙන හරහා ගලා යෑම නිසා එහි පොළව දැඩි බාදනයට ලක්ව ඇත. ගම්වැසියන් පැවසූ ආකාරයට දැනට අවුරුදු කිහිපයකට පෙර අරණ්‍යවාසී භික්ෂුන්වහන්සේ නමක් මෙහි වැඩ වාසය කර ඇත.

6.15.5 ස්ථාන අංක 34 - ගුහා අංක 5
(සැලසුම 19)

මෙම ගුහාවේ කටාරමක් ඇතත් සෙල්ලිපියක් කොටා නැත. අවට පරිසරයේ භූමිය මතුපිට පුරාණ වළංකටු විසිර පවතී. ගුහාව දකුණු දිශාගත ය.

6.16 ස්ථාන අංක 35 - මච්ගල පිහිටි පුරාණ ජනාවාස ගොඩැල්ල
ස්ථානීය පිහිටීම- 6 6 34 53.4/80 50 51.9

පුරාණ වළං කැබලිති සහ ගඩොල් කොටස් මෙම ගොඩැල්ලේ පොළව මතුපිට හාත්පස විසිර පවතී. මෙම වළංකටු කැබලිති අතර කාල-රක්ත වර්ණ

වළං කැබලි ද දකින්නට තිබේ. ගොඩැල්ල මීටර 75 x 80 ත් අතර භූමි භාගයක ව්‍යාප්තව ඇත. මෙය මෙම වාර්තාව මඟින් විස්තර කෙරෙන ලෙන් විහාර සමුච්ඡය පිහිටා ඇති කඳු වළල්ලට ආසනයේ පිහිටා ඇත.

## 6.17 ටැම්කැටිය

ටැම්කැටිය යනුවෙන් හැඳින්වෙන්නේ කල්තොට ප්‍රදේශයේ විසිර පවතින ගුහා සමුච්ඡයේ නැගෙනහිර කොටසයි. ටැම්කැටිය යනු ප්‍රදේශයේ ජනයා එයට ලබා දී ඇති නූතන නාමයයි. 'ටැම්' යන පදය 'කුළුණු' යන පදයට පර්යාය වෙයි. කඳු බෑවුම්වල ශේෂ වූ ගල්කුළුණු විශාල ප්‍රමාණයක් දැනුදු ද දැක ගත හැකි අතර මෙම ප්‍රදේශය ටැම්කැටිය යනුවෙන් හඳුන්වන්නට ඇත්තේ එම හේතුව නිසා විය හැකි ය.

6.17.1 ස්ථාන අංක 36 - ගුහා 1 (සැලසුම 20)


ටැම්කැටියේ පහළ සමෝච්ච රේඛා මට්ටමක මෙම ගුහාව පිහිටා ඇත. කටාරම පැහැදිලිව දැක ගත හැකි අතර ඉන් කොටසක් බාදනයට ලක්වීම නිසා කඩා වැටී ඇත. සෙල්ලිපියක් දක්නට නැත. ගුහාව ගිණිකොණ දිශාවට මුහුණ ලා පිහිටා ඇත. මෙය මෙම ප්‍රදේශයේ සිටි භික්ෂූන්වහන්සේලා විසින් භාවිතා කරන්නට ඇති පැරණිම ලෙන් වලින් එකක් විය හැකි ය.

6.17.2 ස්ථාන අංක 37 - ගුහාව 2
ස්ථානීය පිහිටීම- 6 35 11.3/80 50 32.9

මෙ ගවේෂණය අතරතුර විමර්ශනයට ලක් කරන ලද තවත් එක් ගුහාවකි. ගුහාව උතුරු දිශාවට මුහුණ ලා පිහිටා ඇති අතර එහි කටාරම් කොටා තිබීම මෙම ගුහාව මූල්ඓතිහාසික යුගයේ දී බෞද්ධ භික්ෂූන් විසින් භාවිතා කළ බවට සාක්ෂි සපයයි. කිසිදු සෙල්ලිපියක් කොටා නොමැත. ගුහාවේ අභ්‍යන්තරය අවටින් සෝදා පැමිණි තැන්පත් වූ ගල්බොරළුවලින් පිරී ඇත. ස්වභාවික බාදනයට ලක් වීම නිසා කටාරමේ කොටසක් කඩා වැටී ඇත. මෙය එම ප්‍රදේශයේ මුල්කාලීනව භාවිතයට පත් ගුහාවලින් එකකි.

6.17.3 ස්ථාන අංක 38 - ගුහාව 3

මෙම ගුහාවේ කටාරම් දෙකක් කොටා ඇත. එසේ නමුත් ඒවාට යටින් කිසිදු සෙල්ලිපියක් කොටා නොමැත. ගුහා බිත්තියේ සහ පියස්සේ කළ පුරාණ බදාම ආලේපය එහි පියස්සේ තැනින්




*ඡායාරූපය අංක 17. කල්තොට පුහුල්යායේ ඇති කටාරම් කෙටූ තවත් ගුහාවක්. මෙහි සෙල් ලිපියක් කොටා ඇත (ඡායාරූපය. රාජ් සෝමදේව).*

තැන තවමත් ශේෂ වී ඇත.

6.17.4 ස්ථාන අංක 39 - ගුහා 4 (සැලසුම 21)
ස්ථානීය පිහිටීම- 6 35 12.0/80 50 33.7

මෙය ටැම්කැටිය කඳු බෑවුම පාමුල ඇති විශාල ගල්පර්වත කිහිපයක් එකට එකතු වී සකස් වූ ගුහා පියස්සකි. ප්‍රවේශය වයඹදිග දිශාවට විවෘත ය. ගුහා පියස්සේ කෙලවර කටාරම් දෙකක් කොටා ඇත. ඒවාට පහළින් බ්‍රාහ්මී අක්ෂරවලින් ලියූ සෙල්ලිපියකි. ගුහාව තුළ කළ කැණීමෙන් හුණු බොරළු මිශ්‍ර බදාමයෙන් සකස් කළ පුරාණ ගෙබිමක් සොයා ගැනීමට හැකි විය. මීට අමතරව උතුරු ඉන්දියානු කාලවර්ණ උද්දීප්ත වළං කැබලිති තුනක් ද මෙම කැණීම අතුරතුර දී සොයා ගන්නා ලදී.



*ඡායාරූපය අංක 18. බුදුගල ඇති ස්වාභාවික ගල්පුවරුවක කොටා ඇති සිංහ රුව. සිංහරුවට ඉදිරියෙන් අලියෙකුගේ හොඬවැලක සටහනක් ඇඳ ඇත. ගලෙහි රේඛා ඇඳි පෘෂ්ටය විශාල වශයෙන් ඛාදනයට ලක්වීම නිසා එම රුව ඡායාස්ථිතික සටහනෙහි මැනවින් පිටපත් වී නැත (පිටපත් කිරීම. දිනේෂ් දේවගේ සහ ලක්මාල් චතුයාය.*


6.17.5 ස්ථාන අංක 40 - ගුහාව 5 (සැලසුම 22)
ස්ථානීය පිහිටීම-6 35 09.2/80 50 34.4

මෙය ඉහතින් සඳහන් කළ ස්ථාන අංක 34 ට මීටර 10 ක් ඉහළින් පිහිටා ඇත. එහි කටාරමක් සහ ඊට පහළින් සෙල්ලිපියක් ද කොටා ඇත. ගුහාව තුළ මේ වන විට ආවාසයක් ඉදි කර ඇති අතර එහි භික්ෂූන්වහන්සේ නමක් වැඩ සිටී. ගුහා ප්‍රවේශය දකුණු දිශාවට මුහුණ ලා ඇත.

6.17.6 ස්ථාන අංක 41 - ගුහාව 6 (සැලසුම 23)
ස්ථානීය පිහිටීම-6 35 12.4/80 50 24.3

මෙම ගුහාව ටැම්කැටියේ පහළ සමෝච්ච රේඛා මට්ටමක පිහිටා ඇත. ගුහාවේ කටාරමක් කොටා ඇති අතර එයට පහළින් සෙල්ලිපියක් දක්නට ඇත. ගුහා ප්‍රවේශය දකුණු දිශාවට මුහුණ ලා ඇත.

6.18 ස්ථාන අංක 42 - ජනාවාස ගොඩැල්ල
ස්ථානීය පිහිටීම-6 35 11.0/80 50 14.2



*ඡායාරූපය අංක 19. ඉහත සඳහන් කළ ගල් පෘෂ්ටය මත ඇඳි තවත් රූ සටහන්. එහි මානව රූ දෙකක් ( පුරුෂයෙකුගේ සහ ස්ත්‍රියකගේ) සහ තවත් ජ්‍යාමිතික සංකේත කිහිපයක් ඇඳ ඇත. මෙම රූපවල අර්ථය දුරවබෝධය (පිටපත් කිරීම. දිනේෂ් දේවගේ සහ ලක්මාල් චතුයාය.*



*ඡායාරූපය අංක 20. කුරගල ඇති ගඩොලින් කළ සංරක්ෂණය කරන ලද දාගැබ (ඡායාරූපය. දිනේෂ් දේවගේ).*

මෙය පැරණි වළං කැබලති දැඩි ඝනත්වයකින් භූමිය මතුපිට පැතිරුණු ගොඩැල්ලකි. වළංකටුවල පැතිරීම ආසන්න වශයෙන් මීටර 200 x 100 අතර පමණ වන අතර මෙය තරමක් විශාල ජනාවාසයක් වශයෙන් පැවති ස්ථානයක් විය හැකි බව එමගින් අනාවරණය කරයි. මතුපිටින් සොයා ගත් පුරාවස්තු අතර කාල-රක්ත වළං කැබලිති දක්නට ලැබුණු අතර එමගින් මෙම ස්ථානය මූල්ඓතිහාසික යුගයේ සිටම ජනාවාස වී පැවති බව තහවුරු කරයි.

## 6.19 වැලිපොතේයාය

6.19.1 ස්ථාන අංක 43 - ගුහාව 1 (සැලසුම 24)
ස්ථානීය පිහිටීම-6 35 47.9/80 51 29.7

මෙය කල්තොට වැලිපොතේයාය ගම්මානයේ කඳු බෑවුමේ පිහිටි ගුහාවකි. කල්තොට- දියවින්න ප්‍රධාන මාර්ගයේ 17 වන සැතපුම් කණුව අසලින් හැරී අඩිපාර දිගේ කිලෝමීටර් 2 ක් පමණ ගිය තැන මෙම ස්ථානය මුණ ගැසේ. මෙම ගුහාවේ කටාරම් කොටා ඇතත් සෙල්ලිපියක් දක්නට නැත.

6.19.2 ස්ථාන අංක 44 - ගුහාව 2 (සැලසුම 25)
ස්ථානීය පිහිටීම-6 05 46.1/80 51 30.0

මෙම ගුහාව වැලිපොතේයාය ගුහා අංක 1 ට මීටර 15 ක් ඊසාන දෙසින් පිහිටා ඇත. කටාරමක් කොටා ඇතත් සෙල්ලිපියක් දක්නට නැත. මෙය වෙනත් ගල් පර්වතයකින් බිඳී ගිය කොටසකින් නිර්මාණය වී ඇති අතර එම පැල්ම නිසා තවත් ගුහා අවකාශයක් නිර්මාණය වී ඇත. ගුහා ප්‍රවේශය දකුණු දිශාවට විවෘත වේ.

6.19.3 ස්ථාන අංක 45 - ගුහාව 3

මෙය ඉහතින් විස්තර කර ඇති වැලිපොතේයාය ගුහා අංක 2 ඉදිරියෙන් ඇති ගුහාවයි. ගුහා ප්‍රවේශය ඊසාන දිශාවට විවෘත වේ. කටාරමක් කොටා තිබුන ද සෙල්ලිපියක් දක්නට නැත. කටාරමේ කොටසක් කඩා වැටී ඇත.

6.19.4 ස්ථාන අංක 46 - ගුහාව 4 (සැලසුම 26)
ස්ථානීය පිහිටීම- 6 35 44.5/80 51 31.1

වැලිපොතේයාය ගුහා අංක 3 ට මීටර 50ක් නැගෙනහිරින් පිහිටා ඇති මෙය කටාරම් කෙටූ ගුහාවකි. එහෙත් කටාරමට පහළින් කිසිදු සෙල්ලිපියක් කොටා නැත. ගුහා ප්‍රවේශය නැගෙනහිර දිශාවට විවෘත වේ. මීටර 200 ක මධ්‍යන්‍ය මුහුදු මට්ටම් උසකින් ගුහාව පිහිටා ඇත.

6.19.5 ස්ථාන අංක 47 - ගුහා අංක 5
ස්ථානීය පිහිටීම- 6 35 45.0/80 51 29.0

වැලිපොතේයාය ගම්මානයේ පිහිටි මෙය විශාල ගල්පර්වත කිහිපයකින් වට වී ඇති ගුහාවකි. ගුහා ප්‍රවේශය උතුරු දිශාවට විවෘත වේ. කටාරම් කොටා තිබුන ද එහි පියස්සේ කිසිදු සෙල්ලිපියක් කොටා නොමැත. ගුහාව මීටර 230 ක මධ්‍යන්‍ය මුහුදු මට්ටම් උසකින් පිහිටා ඇත.

6.19.6 ස්ථාන අංක 48 - ගුහාව 6
ස්ථානීය පිහිටීම- 6 35 45.8/80 51 29.2

මෙය කටාරම් කෙටූ ගුහාවකි. එහෙත් සෙල්ලිපියක් කොටා නැත. ගුහාව පිහිටා ඇත්තේ මීටර 240 ක මධ්‍යන්‍ය මුහුදු මට්ටම් උසකිනි. ගුහා ප්‍රවේශය මුහුණ ලා ඇත්තේ ඊසාන දිශාවට ය.

6.19.7 ස්ථාන අංක 49 - ගුහාව 7
ස්ථානීය පිහිටීම- 6 35 45.4/80 51 28.7

මෙය උතුරට දිශානුගතව ඇති කටාරම් සහිත ගල් ගුහාවකි. ගුහාවේ අභ්‍යන්තර අවකාශය තුළ කැඩී බිඳී ගිය ගඩොල් කැබලි විසිර පවතී. එහෙත් ගඩොල් බිත්තියක් පැවති බවට කිසිදු සලකුණක් නැත. ගුහාව මීටර 240 ක මධ්‍යන්‍ය මුහුදු මට්ටම් උසකින් පිහිටා ඇත.

6.19.8 ස්ථාන අංක 50 - ගුහාව 8
ස්ථානීය පිහිටීම- 6 35 46.2/80 51 27.5

වයඹට දිශානුගත මෙය කටාරම් කෙටූ ගල් ගුහාවකි. කටාරමේ කොටසක් කැඩී වැටී ඇති අතර එමගින් මෙම ගුහාව ඉතා දීර්ඝ කාලයක සිට භාවිතයට ගත් බව තහවුරු වේ. ගුහාවට දකුණු පැත්තෙන් ස්වාභාවික වතුර පහරක් ගලා යයි. මෙහි උස මධ්‍යන්‍ය මුහුදු මට්ටමේ සිට මීටර 290 කි.

6.20 ස්ථාන අංක 51 - බුදුගල නටබුන්
ස්ථානීය පිහිටීම- 6 38 03.2/80 52 30.7

බුදුගල පුරාවිද්‍යාත්මක නටබුන් පිළිබඳ මුලින්ම වාර්තා කරන ලද්දේ සී.එච්. කොලින්ස් විසිනි (1932). ඉන්පසුව මේ පිළිබඳ යම් ප්‍රාමාණික විස්තරයක් කර ඇත්තේ එල්. ඒ. ආදිත්‍ය විසිනි (1971). මේ ස්ථානය සම්බන්ධව ඔහු විසින් සපයන කෙටි විස්තරය එය හඳුන්වා දීමට බෙහෙවින් ප්‍රමාණාත්මක බව පෙනේ. ඒ පිළිබඳ ඔහු මෙසේ සඳහන් කරයි;

................ දැනට සොයා ගත හැකි නටබුන් නැගෙනහිර සහ බටහිර අක්ෂගතව ව්‍යාප්ත වී ඇත. වඩා පුළුල්ව බැලූ කල්හි ඒවා කාණ්ඩ තුනකට වර්ග කළ හැකි ය.



*ඡායාරූපය අංක 21. බුදුගල ඇති නටබුන් ගොඩනැගිලිවලින් එකක් (ඡායාරූපය. කුංචන මාතොටආරච්චි).*

1. පහළ කාණ්ඩය - එක සමාන ගොඩනැගිලි දෙකකින් ද, සඳකඩ පහණකින් ද, කැසිකිලි ගලක් හා බෝධි වෘක්ෂයක් කැටයම් කළ ගල් පුවරුවක් ද ස්භාවික ගල් පර්වතයක් මත තැනූ නටබුන් ස්තූපයකින් ද යුක්ත ය.

2. ගල් පඩි පෙළ - කැටයම් කළ කොරවක්ගලකින් සහ ඒ කාණ්ඩ දෙක සම්බන්ධ කරන ශිලාමය අත්වැලකින් යුක්ත ය.

3. ඉහළ කාණ්ඩය - එක සමාන ගොඩනැගිලි දෙකකින් යුක්ත වේ, ' සිනාසෙන සිංහයා' ( එය හැඳින්වීමට මා වඩාත් කැමති ආකාරයට) පාදෝනි එසේත් නැත්නම් පා දෝවනය කිරීම සඳහා තැබූ ජල භාජනය, ' පතිත සිංහයකු' සහ එහි අනෙක් කෙළවරේ ත්‍රිශූලයක් සහ ස්වස්තිකයක් ද මීන රූපය යන දෑ සමග මිථුන රූපය කැටයම් කළ ස්භාවික ගල්පුවරුව දැකගත හැකි ය. කඳු ඉස්මත්තට වන්නට තවත් බොහෝ නටබුන් ඇති අතර මේ සම්බන්ධව වඩා විධිමත් සමීක්ෂණයක් සහ වාර්තාකරණයක් එකී කාර්යය සඳහා වඩාත් සුදුසු පුද්ගලයින් විසින් කරනුයේ නම් බෙහෙවින්ම අගනේ ය (1971: 151). මෙම ස්ථානය පිළිබඳ සම්පූර්ණ සොයා බැලීමක් 2014 දී සිදු කළේ ය (බලන්න රූපසටහන් 18 සහ 19).

## 7. සෙල්ලිපි

මෙම සමීක්ෂණයේ පළමු අදියර යටතේ සෙල්ලිපි 17 විමර්ශනයට ලක් කළ අතර ඉන් 12 ක ස්පර්ශලාංඡන පිටපත් ලබා ගැනිණි. මේවායින් සමහරක් සෙල්ලිපි පිළිබඳ අධ්‍යයනය කර ඇති අතර ඒවා දැනටමත් ප්‍රකාශයට පත් කර ඇත. එහෙත් එම සෙල්පිලි දාහතෙන් දහයක්ම මෙතෙක් ප්‍රකාශයට නොකළ අලුතෙන්ම සොයා ගත් සෙල්ලිපි ය. සී. එච්. කොලින්ස් විසින් කුරගල සහ එහි අවට ඇති වෙනත් ස්ථානයන් හි දුටු සෙල්ලිපි කිහිපයක විස්තරාත්මක නේත්‍ර පිටපත් ලබාගෙන ඇත (Collins 1939). ඊට පසු අවස්ථාවක දී පූජ්‍ය කිරිඇල්ලේ ඥානවිමල හිමියන් ද කොලින්ස් ගත් මගම යමින් කුරගල ඇති සෙල්ලිපි බොහෝමයක නේත්‍ර පිටපත් සටහන් කරගෙන ඇත (Ganawimala 1946:157-158). මහාචාර්ය පරණවිතාන විසින් පසුකලක දී කිරිමකුල්ගොල්ලේ සෙල්ලිපි දෙකක සහ කුරගල සෙල්ලිපි දෙකක නිවැරදි ස්පර්ශලාංඡන පිටපත් ප්‍රකාශයට පත් කළේ ය (Paranavitana 1970). සෙල්ලිපි සමස්තය තුළම බෞද්ධ භික්ෂූන්වහන්සේලාට ලෙන් පූජා කිරීම පිළිබඳ කෙටි වැකි අන්තර්ගත වන අතර එය ශ්‍රී ලංකාවේ මුල්කාලීන බුදුසමය තුළ පැවති පොදු ආගමික කටයුත්තක් වූවේ ය.

මේ දක්වා ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වලින් සොයා ගත් ඒ අන්දමේ සෙල්ලිපි 2000 කට ආසන්න සංඛ්‍යාවක් වාර්තා ගත කර ඇත. පරණවිතාන විසින් එම ඉතා අනර්ඝ ඓතිහාසිත ලේඛනවල අන්තර්ගතය, පුරාඅක්ෂරවේදය, ව්‍යාකරණ පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් සිදු කරන ලදී (1970 : xvii-xlv). මෙම රචනයේ අරමුණ වන්නේ යථෝක්ත සමීක්ෂණයේ දී පිටපත් කරගත් සෙල්ලිපි එකතුව පිළිබඳ නව පර්යාවලෝකනයකින් බැලීමයි. මෙයට හේතුව වන්නේ පිටපත් කරන ලද සෙල්ලිපිවල පුරාඅක්ෂරවේදයේ සහ අන්තර්ගතයේ යම් සුවිශේෂීතා දක්නට ලැබීමය.

### 7.1 පුරා අක්ෂරවේදය

අප සතුව ඇති සෙල්ලිපි එකතුවේ එක් සෙල්ලිපියක එන එක් අකුරක් ශ්‍රී ලංකාවෙන් හමුවන අනෙක් සමකාලීන බ්‍රාහ්මී සෙල්ලිපි වල දක්නට ලැබෙන එම අක්ෂර රූපයට වඩා වෙනස් ය. මෙය *වැලිපොතේයාය* සුදර්ශනාරාම විහාරයෙන් හමුවන සෙල්ලිපියේ සඳහන් 'රො' අක්ෂරයයි. එහි 'රොනි' නමින් හැඳින්වෙන පරුමකවරියකගේ පුද්ගල නාමයක් දැක් වේ. මෙම වචනය පටන් ගැනෙන 'රො' අක්ෂරය සිරස් කෙටි රේඛාවකින් දක්වා ඇති අතර එහි අග්‍ර දෙක දකුණු දෙසට වක් වේ. මෙම වක් වූ අග්‍රයන්ට සම්බන්ධ වී ඉවතට විහිදෙන තවත් කෙටි හරස් රේඛා දෙකකි. කෙටි හරස් ඉර ඉහළින් සහ පහළින් වක්‍ර රේඛාවේ අග්‍රයට යා වේ (බලන්න රූපසටහන 7.1.2). එය ලේඛන දෝෂයක් නොවිය හැක්කේ මධ්‍ය සිරස් රේඛාවට බද්ධ කොට ඇති අනෙක් රේඛා පැහැදිලිව අක්ෂරයක් කෙටීමට සිතා මතාම කළ ඒවා බව පෙනෙන්ට තිබීම නිසා ය. මෙම අමතර එකතු කිරීම්වලින් පැහැදිලි වන්නේ, එනම් 'ර' නම් ව්‍යඤ්ජනාක්ෂරය තුළ 'ඕ' ස්වරයේ මධ්‍ය රූපය අන්තර්ගත කිරීමෙන් අදහස් කළේ 'රො' අක්ෂරය දැක්වීමට බව පැහැදිලි ය. 'ර' අක්ෂරය කෙලින් දැක්වූ සිරස් රේඛාවක් සේ දැක්වීම එය ලිවීම සඳහා භාවිතා කළ සාම්ප්‍රදායික ක්‍රමයයි. එය ඇතැම් අවස්ථාවල දී රැළි සහිතව ද දක්වා

ඇත. මේ පිළිබඳ පරණවිතානගේ මතය වන්නේ;

...............................'ර ' අක්ෂරය ද හැඩ දෙකකින් හමුවී ඇත. ඉන් එකක් ඍජු සිරස් රේඛාවක් සේ දක්වා ඇති අතර අනික රැළි සහිත ය........ මෙම රැළි සහිත 'ර ' අක්ෂරය මේ දක්වා ශ්‍රී ලංකාවේ බ්‍රාහ්මී අක්ෂරවල වඩා පොදුවේ භාවිත කළ අක්ෂරයයි. එය අනිකෙන් පරිණාමය වූවා යැයි සිතිය නොහැකි අතර එකක් තව එකකට වඩා පැරණි යයි පැවසීම ද අපහසු කරුණකි (1970:xx).

ඔහු විසින් දක්වා ඇති පරිදි එම ආකාර දෙකම අපගේ සෙල්ලිපි එකතුව තුළ පොදුවේ දැක ගත හැකි අතර මෙහි සාකච්ඡාවට බඳුන් වන අක්ෂරය හඳුනාගැනීම ඒ අතර සුවිශේෂ සිදුවීමකි. වැලිපොතේයාය සෙල්ලිපියේ 'රො' අක්ෂරය එදවස භාවිත සාමාන්‍ය ක්‍රමයට වෙනස්ව නව ආකාරයකින් ලිවීමට හේතුව සොයා බැලීම වටී.

මෙම 'රොනි' නම් වචනය සහ එහි විවිධ ස්වරූප ශ්‍රී ලංකාවේ සමකාලීන තවත් බොහෝ සමකාලීන සෙල්ලිපිවල දැකගත හැකි ය. උදාහරණයක් වශයෙන් *පදියගම්පොලකන්දේ* (*CJSG* II:190) ඇති එක් සෙල්ලිපියක ද, තෝරවමයිල්ලෑව ගුහා ලිපියේ ද (*JRASCB* NS V:154-5), මිහින්තලාවේ ඇති එක් සෙල්ලිපියක ද (*EZ* V:210), බ්‍රාහ්මණයාගමින් හමුවන සෙල්ලිපිවලින් එකක ද(*UCR* III:124), පුහුලේවිහාර ලෙන් ලිපියේ ද (*CJSG* II:202), නුවරකන්ද ගුහා ලිපිවලින් එකක ද (*CJSG* II:126; *UCR* VIII:126), පෙරියපුලියන්කුලමේ ඇති සෙල්ලිපිවලින් එකක ද (*EZ* V:234), හුනුවල විහාර ලෙන් ලිපියේ ද (*CJSG* II:202), මන්ඩගල ලෙන්ලිපිවලින් එකක ද (*ASCAR* 1934: 21), සහ එරුපොතානෙන් හමුවන ලෙන් ලිපිවලින් එකක ද (*EZ* V:237), හමුවුන ද මේ සෑම අවස්ථාවකම දක්නට ඇත්තේ එකී අක්ෂරය ලියූ සාමාන්‍ය ආකාරයයි.

'ර ' අක්ෂරයට අතිරේක සිරස් ඉරි දෙකක් සම්බන්ධ කොට මධ්‍ය 'ඔ' ස්වරය දක්වා ඇත. මෙය සිදු කළ ආකාරය පරණවිතාන විසින් මෙලෙස විස්තර කරයි.

............. 'ඔ' සංඥාව සම්බන්ධ කරන ආකාර තුනක් හඳුනාගෙන ඇත. 'ලො' අක්ෂරයේ දී....... මධ්‍ය 'ඔ' ස්වරය දක්වා ඇත්තේ එහි ඉහළ සිරස් අක්ෂයෙන් දකුණු දෙසට විහිදෙන කෙටි තිරස් රේඛාවකින් වන අතර මෙවැනිම තවත් රේඛාවක් පහළින් වම්පැත්තට විහිදේ. එහි සිරස් ඉරි සහ ඒ අතර ඇති 'ල' අක්ෂරයේ ඉහල සිරස් කොටස 'ල' අක්ෂරයට අන්තර්බද්ධ වූ 'ඔ' අක්ෂරයක හැඩය ගනී. 'බො' අක්ෂරය..........සිරස් අක්ෂ දෙපසින් දකුණටත් වමටත් කෙටි තිරස් ඉරි දෙකක් එකම මට්ටමකින් විහිදේ. 'සො' අක්ෂරය...........මධ්‍ය 'ඔ' ස්වරය දක්වා ඇත්තේ අක්ෂරයේ ඉහළට උල් වූ කොටසට සම්බන්ධ කළ දකුණටත් වමටත් විහිදෙන කෙටි තනි තිරස් රේඛාවකිනි (*එම*).

පූර්ව බ්‍රාහ්මී ලේඛනවල 'ර' අක්ෂරය ලියූ පොදු ආකාරය සහ අක්ෂරවලට මධ්‍ය 'ඔ' ස්වරය බද්ධ කිරීම සඳහා අනුගමනය කළ ක්‍රමය සලකා බලා අප විසින් විමර්ශනයට ලක් කළ වැලිපොතේයාය සෙල්ලිපියේ එන 'රො' අක්ෂරය ද පුරාඅක්ෂරවේදමය වශයෙන් සුවිශේෂී අවස්ථාවක් ලෙස හඳුනාගත හැකි බව අවිශ්වාසයකින් තොරව නිගමනය කළ හැකි ය. මා විසින් ඉහත දී දැක් වූ ආකාරයෙන්, මෙම සෙල්ලිපියේ 'ර' අක්ෂරය අවස්ථා දෙකක දී සඳහන් වන අතර එම අවස්ථා දෙකේදී ම ශිල්පියා විසින් එය දක්වා ඇත්තේ රැළි ස්වභාවයෙනි. එය එම අක්ෂරය ලියූ පොදු ආකාරයයි. මෙහි ඇති ගැටළුකාරී තත්ත්වය නම් ශිල්පියා විසින් එකම අක්ෂරය එක සෙල්ලිපියක් තුළ ආකාර දෙකකින් සටහන් කළේ ඇයි ද? යන්න යි. මේ සඳහා පිළිතුරු දෙකක් යෝජනා කළ හැකි ය. ඉන් පළමු වැන්න නම් එය ලේඛන දෝෂයක් ලෙස සැලකීමයි. මෙම රචනයේ අප විසින් දැක් වූ පරිදි, මෙම අක්ෂරය ලියා ඇති පැහැදිලි ස්වරූපය අනුව මෙය සටහන් කිරීමට ශිල්පියා සතු වූ නිශ්චිතභාවය පෙන්නුම් කරයි. එහෙයින් මෙම නව අක්ෂර හැඩය ලේඛන දෝෂයකින් සටහන් වූ අක්ෂරයකට සමාන කිරීම එහි සුවිශේෂීභාවය අවතක්සේරුවට ලක් කරන සරල සාමාන්‍යකරණයක් විය හැකි ය. එහෙයින් 'රො' අක්ෂරය ලිවීම සඳහා වෙනත් විකල්ප ආකාරයක් ද එකල සිටි ශිල්පීන් විසින් දැන සිටින්නට ඇතැයි යන නිගමනයට එළඹීම වඩාත් යුක්ති යුක්ත ය. පුරාඅක්ෂරවේදමය දෘෂ්ටිකෝණයකින් බැලූ කළ එම සෙල්ලිපියේ එන අනෙක් පුරාඅක්ෂරවිද්‍යාත්මක වෙනස නම් 'ල' අක්ෂරය එහි මධ්‍යගත 'උ' ස්වරයක් සහිතව විකල්ප ආකාරයකින් ලිවීමයි. 'ල' අක්ෂරය ලියන සාමාන්‍ය ආකාරය නම් නම් බිලී කොක්කක් වම් පසට හැර වූ ආකාරයකින් අක්ෂරය වම් පසින් පටන් ගැනෙන තැනට කෙටි තිරස් රේඛාවක් සම්බන්ධ කිරීමයි. මධ්‍යගත 'උ' ස්වරය ඕනෑම අකුරකට එකතු කිරීම සම්බන්ධ පොදු භාවිතය වූයේ අක්ෂරයේ සිරස් හෝ වක් වූ පදනම් රේඛාව යටින් එල්ලා වැටෙන කෙටි සිරස් රේඛාවක් සේ දැක්වීමයි. මෙය 'ල' අක්ෂරය සමඟ මධ්‍යගත 'උ' ස්වරය සම්බන්ධ කොට ලියූ විකල්ප අවස්ථාවක්

වන අතර මෙහි දී දකුණු සිරස් රේඛාවට කෙටි තිරස් රේඛාවක් සහ කෙටි සිරස් රේඛාවක් සම්බන්ධ කර තිබීම නිසා මෙය කොටස් දෙකක් අනුබද්ධ කළ අක්ෂරයක් වශයෙන් පෙනේ. මෙම විකල්ප අක්ෂර හැඩය දිවයිනේ තවත් ස්ථාන විසිතුනක දී නිරීක්ෂණය කළ හැකි ය. ජෝන් ස්ටීල් විසින් මෙම අක්ෂරය *'ලා'* වශයෙන් කියවා තේරුම්ගෙන ඇත (*ASCAR* 1905:43- 49) එච්. පාකර් විසින් එය දන්තජ 'ල' වශයෙන් ගනී (Parker 1909:431). කෙසේ වුව ද එහි දී පාකර්ට තමිල්නාඩුවේ ඇති බ්‍රාහ්මී අභිලේඛනවල එන මෙම අක්ෂරය ඇතුළත් සෙල්ලිපි කියවා අර්ථ විවරණය කළ කේ. වී. සුබ්‍රමනියම් අයියර් ගේ අදහස්වල ආභාසය ලැබෙන්නට ඇති බව සිතිය හැකි ය (1925:275-300).



7.1.1 උඩුපියන් ගල්ගේ ලෙන් ලිපිය (*JRASCB* XXXII:170; Paranavitana 1970:771)

පෙළ - *පරුමක උතරගුත පුතන පරුමක චුලහ බත කසබහ*
අර්ථය -පරුමක උත්තරගුප්තගේ පුත්‍රයා වූ පරුමක චූලගේත් සහ බත කාශ්‍යප ගේත් (ලෙන යි)



7.1.2 සුදර්ශනාරාමය ලෙන් ලිපිය

පෙළ- *රොන ජිතය පරුමක සුදෙව ඣය පරුමකලු රොනිය ලෙනෙ මහසුදශනෙ නම චතුදිශ ශගශ*
අර්ථය - පරුමක ශුදෙවගේ ඇඹේනිය වූත් පරුමක රොනගේ දියණියවූත් රොනි නම් පරුමකවරියගේ ලෙන සතර දිශාවෙන් පැමිණෙන සංඝයාට (පූජා කරන ලදී)



7.1.3 කිරිමකුල්ගොල්ල ලෙන් ලිපි 1

පෙළ - *අශදෙව පුත ශිතදෙව පටිබන කුටෙ අගත අනගත චතුදිශ ශගශ දිනෙ*
අර්ථය - අශ්වදෙවගේ පුත්‍ර ශීතදෙවගේ පටිභාන කුටිය (නම් වූ) ලෙන සතර දිශාවෙන් පැමිණියා වූද නොපැමිණියා වූ ද සංඝයාට පුජා කරන ලදී.



7.1. 4 2 කිරිමකුල්ගොල්ල ලෙන්ලිපි 2

පෙළ - *උපසක ස...... තිස ශගශ*
අර්ථය  - ස....තිස්ස උපාසකයා විසින් සංඝයාට (පුජා කරන ලදී.)



## 7.1.5 කිරිමකුල්ගොල්ල ලෙන් ලිපි 3

පෙළ - *උපසක දිගතිස..............(ශගශ)*


අර්ථය - දීඝතිස්ස උපාසකයා (ගේ ලෙන) සංඝයාට (පූජාකරන ලදී)



## 7.1.6 ටැම්කැටිය ලෙන් ලිපිය 1 (*ASCAR* 1952:42; Paranavitana 1970: 768)

පෙළ - *උපශොන අපි අය කෙර පුත අය ශිවහ ලෙනෙ මනපදශනෙ චතුදිශ ශගශ දිනෙ*

අර්ථය - කෙර නම් කුමරුගේ පුත්‍ර මහ ශිව කුමරුගේ සහ එමෙන්ම උපසෝණගේ ද මහා සුදර්ශන නම් ලෙන සතර දිශාවෙන් (වඩින) සංඝයාට දෙන ලදී.



## 7.1.7 ටැම්කැටිය ලෙන් ලිපිය 2

පෙළ - (අ) *උපශොන*[1] *අය තිශ පුත අය කෙරශො පුතශො අය මහ තිශ ලෙනෙ සුපදිනෙ චතුදිශ ශගශ* (ආ) *යගශ*

අර්ථය - කෙර කුමරුගේ පුත්‍ර වන සහ තිස්ස කුමරුන්ගේ මුණුබුරු, මහා තිස්ස කුමරුගේ මනාව පිහිටියා වූ ලෙන සතර දිශාවෙන් වඩින සංඝයාට (පූජාකරන ලදී). (මෙය) යක්ෂයන්[2] (විසින් කරන ලද්දකි).

---

1 පරණවිතාන (1970:798) විසින් 'උපශොන' සහ 'අපි' යන වචන දෙක අර්ථ විවරණය කර ඇත්තේ ස්ථාන නාමයක් වශයෙනි. ඔහු විසින් 'අපි' යන වචනය පාලි භාෂාවේ එන 'ජලාශය' නම් අර්ථ දෙන 'වපි' යන පදයෙන් නිරුක්ති වූ බව ප්‍රකාශ කළේ ය. ඔහු විසින් 'උපශොන' යන්න 'අපි' යන වචනයෙහි නාම විශේෂණයක් වශයෙන් ගනී. එහෙත් මෙම වචනය නාමපදයක් වශයෙන් සලකනවාට වඩා සමූහාර්ථ දෙන නිසන නිපාතයක් වශයෙන් ගැනීම වඩා සුදුසු බව අපි සිතමු. උදා:- 'තවත් ' යන අර්ථය දෙන පරිදි යෙදෙන (*අහං අපි දත්තුකාමෝ* ...... සංයුක්ත නිපාතය 685)

2 උපාසකයකු විසින් සංඝයාට කළ ලෙන් පූජාවක් පිළිබඳ සඳහන් කිරීම මෙම සෙල්ලිපිය කෙටීමේ අරමුණ වන්නට ඇත. ඔහුගේ නාමය 'උපශොන' වශයෙන් දැක්වේ. පෙළෙහි දැක්වෙන්නෙ .........උපශොන අය තිශ පුත අය කෙරශො පුතශො අය මහ තිශ ලෙනෙ සුපදිනෙ චතුදිශ ශගශ..............යගශ (බලන්න මෙම වාර්තාවේ අංක 7.1.7). සෙල්ලිපියේ අක්ෂරවල මධ්‍යන්‍ය උස සෙ.මී 25 කි. මෙම සෙල්ලිපියේ ඇති විශේෂය නම් සෙල්ලිපියේ ප්‍රධාන පෙළට පහළින් කුඩා අකුරෙන් කෙටූ තවත් කෙටි අක්ෂර පේලියක් පැවතීමයි. එය 'යගශ' වශයෙන් කියවිය හැකි ය. මෙම වචනය සෙල්ලිපිය කෙට වූ පුද්ගලයාගේ මුද්‍රාව වශයෙන් සැලකිය හැකි ය. 'යගශ' යන වචනය වර නැගී ඇත්තේ පුරුෂලිංග සම්බන්ධ විභක්තියේ ය. 'ක' ව්‍යඤ්ජනය වෙනුවට 'ග' ව්‍යඤ්ජනය දක්වා ඇත. මේ ආකාරයෙන් ශ්‍රී ලංකාවේ භාවිත භාෂාවේ මුල් ස්වරූපවල 'ක' ව්‍යඤ්ජනය 'ග' ව්‍යඤ්ජනය වශයෙන් පරිවර්තනය වීම සහ එය ප්‍රතිලෝම වශයෙන් භාවිත කළ අවස්ථා පෙනෙන්නට තිබේ. ස්වර අතර ඇති ඝෝෂයක් එයට අනුරූප ඝෝෂාක්ෂරයක් බවට වෙනස් වීම මුල්කාලීන සෙල්ලිපිවල බහුලව දැක ගත හැකි ලක්ෂණයකි. 'ග' යනු ඝෝෂාක්ෂරයක් වන අතර එය ඝෝෂ ශබ්ද සහිත 'ක' අක්ෂරය බවට පරිවර්තනය කළ හැකි ය. මෙම රීතිය අදාල වන්නේ කණ්ඨජ සහ දන්තජ කාණ්ඩයට අයත් ඝෝෂාක්ෂරයන්ට පමණි. 'ක' සහ 'ග' අක්ෂර කණ්ඨජ අක්ෂර බව අපි දනිමු. එය අතීතයේ දී ශ්‍රී ලංකාව තුළ ප්‍රාකෘත වචන රචනා කරන විට භාවිත වූ ව්‍යාකරණ රීතියකි. පරණවිතාන (1970) විසින් ඉතා පැහැදිලිව දක්වා ඇති පරිදි මෙම ස්වරවිද්‍යාත්මක වෙනස තනිව නිරීක්ෂණය කළ හැක්කේ ශ්‍රී ලංකාවේ මුල්කාලීන සෙල්ලිපිවල පමණි. එය දකුණු ආසියාවේ භාවිත වෙනත් ප්‍රාකෘත භාෂා බොහෝමයක ද දැකගත හැකි නිත්‍ය ලක්ෂණයකි. එහෙයින් 'යග' යන වචනය 'යක' යන වචනයට පර්යාය වන අතර අවසන් 'ශ' අක්ෂරය දක්වා ඇත්තේ සම්බන්ධ විභක්තියේ පසුසර්ගයක් ලෙස ය. එවිට 'යගශ' යන වචනය 'යක්ෂයනට අයත්' හෝ 'යක්ෂයන් විසින් මෙම සෙල්ලිපිය කරන ලදී' යන අරුත් දෙන බව පෙනේ.



7.1.8 ටැම්කැටිය ලෙන් ලිපිය 3

පෙළ - *තිශරකිත තෙරහ මහ ලෙනෙ අපරිමිත ලොක දතුය අගත අනගත චතුදිශ ශගශ*
අර්ථය - තිස්ස රක්ඛිත තෙරුන්ගේ ලෙන අප්‍රමාණ ලෝකධාතුවේ සතර දිශාවෙන් ම පැමිණි නොපැමිණි සංඝයාට (පූජා කරන ලදී).




7.1.9 පබ්බත විහාරයේ ලෙන් ලිපි 1[3]

*පෙළ - පරුමක තිශහ ලෙනෙ*
*අර්ථය - තිස්ස නම් ප්‍රධානියාගේ ලෙන*



7.1.10 පබ්බත විහාර ලෙන් ලිපි 2
පෙළ - *බත ශොනහ*
අර්ථය - සෝන නම් ප්‍රධානියාගේ (ලෙනයි)



7.1.11 පබ්බත විහාර ලෙන් ලිපි 3

පෙළ - *පරුමක ශොන පුතහ බත පුනශ ගුතශ*
අර්ථය - නායක ශෝනගේ පුත් වූ පූර්ණගුප්ත නම් ප්‍රධානියාගේ (ලෙනයි)

3 මෙම ලිපිය ලියා ඇත්තේ දකුණේ සිට වමටය.




7.1.12 පුහුල්යාය ලෙන් ලිපිය

පෙළ - *පරුමක ශොමදෙවය ලෙනෙ අගත අනගත චතුදිශ*
අර්ථය  - සෝමදේව නම් ප්‍රධානියාගේ ලෙන සතර දිශාවෙන් පැමිණි නොපැමිණි සංඝයාට දෙන ලදී



7.1.13 කුරගල ලෙන් ලිපිය 1(JRASCB XXXII:167; ASCAR 1961-62:82; Paranavitana 1970:774-776)

පෙළ - *..................... දතහ සමුදහ ලෙනෙ*
අර්ථය -   දත්ත (සහ) සමුද්‍රගේ ලෙන..............



7.1.14 කුරගල ලෙන් ලිපි 2

පෙළ - (අ) (පරුමක) සුමනහ

(ආ) පරුමකලු ශුමය

අර්ථය  -  ප්‍රධානී සුමනගේත්, සුම්මා නම් ප්‍රධානීවරියගේත් (ලෙනයි).

## 7.2 හිරිගල් පිළිමය

කල්තොට ගෙවත්තක පොළව සාරමින් සිටි ගැමියන් කිහිප දෙනෙකුට හදිසියේම ස්ඵටිකෘත හුණුගලින් නෙළූ පිළිමයක් හමු විය. එය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ගේ විමර්ශනයට ලක්වීමෙන් පසුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් කල්තොට පිහිටි සංචාරක බංගලාවට ගෙන එන ලදී. මේ වන විටත් එය එහි ප්‍රදර්ශනයට තබා ඇත.

බුදුරජාණන්වහන්සේ හෝ බෝධිසත්ත්වයන් වහන්සේ කෙනෙකු නිරූපනය කිරීම සඳහා හිටි ඉරියව්වෙන් සිටින මානව රුවක් දැක්වෙන පරිදි හුණුගල නෙළා මෙම පිළිමය සකස් කර ඇත. පිළිමයේ උස මීටර 1.59 කි. උරහිස්වල උපරිම පළල සෙන්ටි.මීටර 61 කි. දෙඅත් බිඳී ඇති අතර රූපයේ ඇඟ ලා සිටින වස්ත්‍රය මතුකර පෙන්වීම සඳහා කළ රේඛා මැකී ගොසිනි. සමීප නිරීක්ෂණවල දී පෙනී ගියේ පිළිමයේ සිවුරක් දක්වා තිබුණු බවට කිසිදු සලකුණක් නොමැති බවයි. එහි ඉහළ කොටස මාල පළඳනාවකින් සහ උපවීතයකින් හා සරල ආභරණවලින් සරසා ඇති බව පෙනෙන්ට ඇත. මෙම පිළිමය බුදුපිළිමයක් විය හැකි ද යන සැකය ඇති කරන මෙහි නිරීක්ෂණය කළ හැකි අනිත් සුවිශේෂතාව නම් දෙඋරහිස මත යම්තමින් මතුකර දක්වා ඇති අංගයයි. ශේෂ වී ඇති කොටස් මකර කුණ්ඩලාභරණයක නැතිනම් බෝධිසත්ත්වයන් කෙනෙකුගේ විභූෂිත කර්ණාභරණයක අග කොටස් විය හැකි බව පැහැදිලි ය. ප්‍රතිමාව බෙහෙවින්ම ඛාදනය වී ඇති බැවින් වැඩිදුර හඳුනාගැනීම් බෙහෙවින්ම අපහසු ය. මෙම ප්‍රතිමාව ක්‍රිස්තු වර්ෂ හත්වන සහ අටවන සියවස් අතර කාලයට අයත් විය හැකි බව අනුමාන කළ හැකි ය.



## 7.3 අරාබි සෙල්ලිපිය

ප්‍රායෝගිකව බැලූ කල කුරගල සංස්කෘතිමය වූත් ආගමික වූත් ස්තර දෙකක් පවතින බව නිරීක්ෂණය කළ හැකි ය. හෝලෝසීන යුගයට අයත් ප්‍රාග් ඓතිහාසික දඩකරු-අන්නගවේෂී කණ්ඩායම්වල පැවැත්මට අයත් සාධක සහ මූලඓතිහාසික යුගයට අයත් බෞද්ධ සංඝයාගේ ලෙන් ආවාස පැවතීම හැරෙන්නට එහි ඉහළ ස්ථානයක ඇති ස්වාභාවික ගුහා මතුපිටක කොටා ඇති කෙටි සෙල්ලිපිය මඟින් එම ස්ථානය සමඟ පැවති ආරාබි සම්බන්ධතා නිරූපනය කරයි.

මෙම සෙල්ලිපිය ගුහා අංක 6.2.9 ඉදිරියේ ඇති ස්වාභාවික පිහිටි ගලක සිරස් මතුපිට තනි පෙළකට කියුෆික් අරාබි අකුරෙන් කොටා ඇත. මෙහි අර්ථය දුරවබෝධ ය. ශ්‍රී ලංකාවේ මුස්ලිම් සංස්කෘතිය අධ්‍යයනය කළ ඒ පිළිබඳ ප්‍රාමාණික උගතෙකු වන ආචාර්ය එම්.ඒ.එම්. ශුක්රි විසින් තර්ක කර ඇත්තේ කුරගල සෙල්ලිපියේ ඇති කියුෆික් ශෛලිට අයත් අරාබි අක්ෂරවලට අනුව එය මෙම ස්ථානයට පැමිණි පර්සියානු හෝ උතුරු ඉන්දියානු සම්භවයක් ඇති සූෆී මුනිවරයෙකු විසින් කරන ලද්දක් බවයි. ඔහු මෙසේ දක්වයි;

> ................ යුරෝපීයන් පෙරදිගට පැමිණීමට පෙර මෙම ස්ථානයට ආ ගිය පර්සියානු-උතුරු ඉන්දියානුවන් හෝ පර්සියානු මුනිවරයෙකු විසින් කළා යැයි විශ්වාස කළ හැකි ගුප්ත අක්ෂර තුනකින් සහිත බලංගොඩ ගුහා ලිපිය ගුඪාර්ථ සහිත ය (Gunawardhana *et.al*. 2000:378).


ඓතිහාසික විශ්ලේෂණයන්ට අනුව (උදා. Shukri 2000 & Devaraja 2000), නූතනයේ

*ඡායාරූපය අංක 22. කල්තොටින් සොයා ගත් හිරිගල් බෝධිසත්ත්ව රූපය. මෙය මේ වන විට කල්තොට ඇති පුරාවිද්‍යා සංචාරක බංගලාවේ ප්‍රදර්ශනයට තබා ඇත (ඡායාරූපය. රාජ් සෝමදේව).*

සබරගමුව පළාත නමින් හඳුන්වන ප්‍රදේශයට අරාබි වෙළඳුන්ගේ ආගමනය ක්‍රිස්තු වර්ෂ දහවන වන ශතවර්ෂය තරම් ඈත කාලයක සිදු වූ බව නිගමනය කළ හැකි ය. ශුක්රිගේ අදහස වන්නේ කුරගල අරාබි සෙල්ලිපිය ක්‍රිස්තු වර්ෂයෙන් දහවන හා දහසයවන සියවස් අතර යම් කාලයකට අයත් විය හැකි බවයි (Gunawardhana *et al* 2000: 439). එහෙත් මෙම සෙල්ලිපිය කෙටීම ස්වයංසිද්ධ සිදුවීමක් වන අතර එකී ඓතිහාසික කාලපරිච්ඡේදය තුළ දීර්ඝකාලයක් තිස්සේ එම ස්ථානය තුළ සිදු කළ අරාබි ආගමික කටයුත්තකට කිසිදු සබඳතාවක් දක්වන්නේ නැත. එහෙත් එහි අද්‍යතන මුස්ලිම් ප්‍රජාව විසින් එම ස්ථානයට ආරෝපනය කර තිබෙන අස්පෘෂ්‍ය වටිනාකම් සමස්තය අගය කොට ගරු කළ යුතු ය. භූමිදර්ශනයක් යනු අපගේ හැඟීම් සහ මතක සටහන්වල භාව ප්‍රකාශනයකි. භූමිදර්ශනය යන දෘෂ්ටිවාදී සංකල්පය ශක්තිමත් කරනු ලබන පොදු තේමාවක් නම් අප විසින් කරනු ලබන සියල්ලක්ම සිදුවන්නේ භූමිදර්ශනය පසුබිම කොටගෙන ලෙස සිතීමයි. එනම් එය අපගේ පැවැත්ම පෝෂණය කරන අස්පෘෂ්‍ය අගයන් සහ මානව අර්ථ රැස් කර ඇති කෝෂ්ඨාගාරයකි. භූමිදර්ශනය සහ ස්මෘතිය වෙන් කළ නොහැකි වන්නේ මේ නිසා ය. එනම් පුද්ගල සහ සාමූහික මතක සටහන්වල ස්නායුකේන්ද්‍රය වන්නේ භූමිදර්ශනයයි. (*මේ සඳහා බලන්න, Taylor 2007).*

## 8. සමෝධානය

මෙම වාර්තාව මගින් ඉදිරිපත් කර ඇත්තේ කෙටි කාලපරිච්ඡේදයක් තුළ කළ ක්ෂේත්‍ර ගවේෂණයකින් එකතු කළ දත්ත ය. කල්තොට මොහොර ආශ්‍රිත ප්‍රදේශය තුළ ඇති ඓතිහාසික වටිනාකමක් සහිත ස්ථානවල ව්‍යාප්තිය සම්බන්ධ තවත් බොහෝ කරුණු තවදුරටත් විමර්ශනය කිරීමට නියමිත ය. අප විසින් මෙම ගවේෂණයේ දී නිරීක්ෂණය කළ දෑ මෙරට පුරාවිද්‍යාව සහ



*ඡායාරූපය අංක 23. කුරගල පර්වතයක මතුපිට ආරාබි කියුෆික් අක්ෂරයෙන් කරන ලද ක්‍රිස්තු වර්ෂයෙන් 10 වෙනි ශතවර්ශ යට හෝ ඉන් පසු යුගයට අයත් යැයි සිතිය හැකි අභිලේඛනය.*

ඉතිහාසය හදාරන්නන්ට පමණක් නොව මෙම වාර්තාවේ සඳහන් කර ඇති, විශේෂයෙන්ම ස්මාරක පිළිබඳ සුවිශේෂතාවක් ඇති ස්ථාන සම්බන්ධයෙන් වැඩ කිරීම සඳහා උරුම කලමනාකරුවන්ට සහ ප්‍රතිපත්ති සම්පාදකයන්ට ද අපමණ වැදගත්කමකින් යුක්ත වනු ඇත.

(අ) මෙම ප්‍රදේශයේ විශේෂයෙන්ම කුරගල, දියවින්න සහ විල්ආර ආදි ස්ථානයන්හි පිහිටා ඇති ස්වාභාවික ගුහා සහ ගල්පියැසි හොලෝසීන දඩකරු-අන්නගවේශකයින් විසින් කාලාවර්තිකව තම වාසස්ථාන වශයෙන් භාවිත කර ඇත. කුරගල උතික්ෂිප්තයේ ඇති විවෘත කඳුබෑවුම් දඩකරු-අන්නගවේෂකයින් ට ඉතා ආකර්ෂණීය ජීවන මූලාශ්‍ර වූ බව එහි භූමිය මතුපිටින් එකතු කළ ප්‍රාග්ඓතිහාසික ශිලාමෙවලම්වලින් (තිරිවාණා) පැහැදිලි වේ.

(ආ) බොහෝ ගල්ගුහා සහ ගල්පියැසි පසුකාලීනව ප්‍රමුඛ බෞද්ධ ආරාමයන් වූ බව ඒවායේ ගුහා පියැසිවල දැක ගත හැකි බෞද්ධ භික්ෂූන්වහන්සේලාට එම ගුහා පූජා කළ බව විස්තර කරන සෙල්ලිපිවලින් පැහැදිලි වේ. ඉහත



*ඡායාරූපය අංක 24. කුරගල ඇති ආරාබි අභිලේඛනයේ නෙත් පිටපත (ශුක්රි 2000 ට පසු).*

සඳහන් හත්වන කොටසේ දී සාකච්ඡා කළ පරිදි පුරාඅක්ෂරවිද්‍යාත්මකව බලා එම සෙල්ලිපි ක්‍රිස්තු පූර්ව 250 ට හෝ ඊට ආසන්න පෙර කාලයකට අයත් බව නිර්ණය කළ හැකි ය. බුදුගල නටබුන් මගින් පෙන්නුම් කරන්නේ අවම වශයෙන් ක්‍රිස්තු වර්ෂයෙන් හත්වන හා අටවන සියවස් අතර කාල වකවානුවේ එම ප්‍රදේශයේ පැවති බෞද්ධ පුනර්ජීවනය පිළිබඳ සාධක යි.

කූරගල සමඟ පැවති ආරාබි සබඳතා එහි ඇති අරාබි කියුෆික් සෙල්ලිපිය සැලකිල්ලට ගෙන බැලුවහොත් ඒවා ක්‍රිස්තු වර්ෂයෙන් දහවන සියවසට පමණ අයත් බව සිතිය හැකි ය. ඉන්දියානු සාගර කලාපයේ සිදුවූ ආර්ථික සබඳතා ක්‍රිස්තු වර්ෂ දහවන සියවසින් පසු වෙනස් වූ බව පෙන්වීමට පමණක් නොව එය මෙය ඉතා වැදගත් ඓතිහාසික නිර්ණායකයක් විය හැකි ය.

(ඇ) පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථානවල භූමිය මතුපිට සහ උපපෘෂ්ටවල පවතින සංස්කෘතික අන්තර්ගතය ආරක්ෂා කිරීමට ඒකාබද්ධ සැළසුමක් අවශ්‍ය ය.

(ඈ) මෙම වාර්තාවේ සඳහන් කර ඇති සියළුම පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති ස්ථාන සතු ඓතිහාසිකත්වය සහ ඒවාට ආරෝපණය කර තිබෙන අස්පෘෂ්‍ය වටිනාකම් මහජනතාවට බුක්ති විඳීමට ශ්‍රී ලංකාවේ පුරාවස්තු ආඥාපනත මගින් පනවා ඇති නීතිමය විධි විධාන ආරක්ෂා වන පරිදි අවශ්‍ය ඉඩ පහසුකම් අපක්ෂපාතීව ලබා දිය යුතු බව ද මෙම වාර්තාව තුළින් යෝජනා කර ඇත.

(එ) මෙම වාර්තාව තුළ විස්තර කර ඇති ස්ථාන සතු ප්‍රත්‍යක්ෂ ඓතිහාසිකත්වය සලකා බලා මේවා කලමනාකරණය කිරීම සඳහා අදාල කරගත යුත්තේ ශ්‍රී ලංකාවේ අංක 9 දරණ 1946 පුරාවස්තු ආඥාපනත සහ එයට පසුව කළ සංශෝධනවලින් දක්වා ඇති නීතිමය විධිවිධානයන් ය.

## කෙටි යෙදුම්

*ASCAR* -Archaeological Survey of Ceylon Annual Reports

*CJSG* NS - Ceylon Journal of Science Section ‘G', New Series

*EZ* - Epigraphia Zeylanica

*JRASCB* - Journal of the Royal Asiatic Society (Ceylon Branch)

*UCR* - University of Ceylon Review

## ආශ්‍රිත ග්‍රන්ථ


Adithiya, L. A., 1971. ‘Buried finds at Budugala’. *Ancient Ceylon*, No. 1(January 1971), 151-165pp.

Collins, C.H. 1939. ‘The Archaeology of the Sabaragamuwa Bintenna’.. *JRASCB* XXXII (85): 158-184.

Deraniyagala, P.E.P., 1939. ‘The Stone Age and Cave Man of Ceylon’. JRASCB Vol. XXXIV (92): 351-373

Deraniyagala P.E.P. 1958. ‘An open-air habitation site of Homo sapiens balangodensis’. *Spolia Zeylanica* 28(2):223-61.

Dias, M., 1991. **Epigraphical Notes**. Colombo: Department of Archaeology.

Ganawimala, K. Rev., 1967. **Saparagamu Darshana**. Rathnapura : Sastrodaya.

Medhananda, E. Rev., 2008. **Navatama Shilalipi Gaveshana**. Colombo: Dayawansa Jayakodi

Paranavitana, S., 1970. **Inscriptions of Ceylon. Early Brahmi Inscriptions**. Vol. 1. Colombo: Archaeological Survey of Ceylon.

Parker, H., 1984(reprint). **Ancient Ceylon**. New Delhi: Asian Educational Services.

**Samyukta Nikaya**., 1964 (ed.) Buddha Jayanti Tripitaka Series. 2004 (reprint). Dehivala: Buddhist Cultural Centre.


Somadeva R., 2010. **Archaeology of the Uda Walave Basin**. Occasional Paper 2. Postgraduate Institute of Archaeology. Colombo.

Somadeva R., 2014. **Archaeology of Mountains. Holocene Adaptations of Mountainous Hunter-Gatherers**. Occasional


Paper 3. Postgraduate Institute of Archaeology: Colombo (In press).

Subrahmanyar Aiyer K.V., 1925. 'The Earliest Monuments in the Pandya Country and their Inscriptions'. *The Proceedings and Transactions of the Third Oriental Conference*. Madras.


Taylor, K. , (2007), 'Intangible Cultural Heritage: The Mirror of Cultural Diversity. Some reflections through charters and protocols from Venice to Hoi An' Paper 12 International Conference of National Trusts, Heritage and Development, INTACH, New Delhi 3-5 December 2007.





*සැලසුම් අංක 2. කුරගල ගුහා අංක 3 හි බිම් සැලැස්ම සහ පැති පෙනුම.*





*සැලසුම් අංක 3. කුරගල ගුහා අංක 4 හි බිම් සැලැස්ම සහ පැති පෙනුම.*





*සැලසුම් අංක 4. කුරගල ගුහා අංක 6 හි බිම් සැලැස්ම සහ පැති පෙනුම*





*සැලසුම් අංක 5. කුරගල ගුහා අංක 7 හි බිම් සැලැස්ම සහ පැති පෙනුම.*





*සැලසුම් අංක 6. කුරගල ගුහා අංක 8 හි බිම් සැලැස්ම සහ පැති පෙනුම.*





*සැලසුම් අංක 7. කුරගල පබ්බත විහාරයේ බිම් සැලසුම සහ පැති පෙනුම.*





*සැලසුම් අංක 8 (අ). පබ්බත විහාරයේ ගුහා අංක 1 (අ) හි බිම් සැලසුම සහ පැති පෙනුම.*





සැලසුම් අංක 8 (ආ). පබ්බත විහාරයේ ගුහා අංක 1 (ආ) හි බිම් සැලසුම සහ පැති පෙනුම.





*සැලසුම් අංක 9. පබ්බත විහාරයේ ගුහා අංක 2 හි බිම් සැලසුම සහ පැති පෙනුම.*





*සැලසුම් අංක 10. පබ්බත විහාරයේ ගුහා අංක 3 හි බිම් සැලසුම සහ පැති පෙනුම.*





*සැලසුම් අංක 11. පබ්බත විහාරයේ ගුහා අංක 4 හි බිම් සැලසුම සහ පැති පෙනුම.*





*සැලසුම් අංක 12. විල්ආර ගුහාවේ බිම් සැලසුම සහ පැති පෙනුම.*





*සැලසුම් අංක 13. ඇඳගල නටබුන් වල බිම් සැලසුම.*





*සැලසුම් අංක 14. උල්ගල ගුහාවේ බිම් සැලසුම සහ පැති පෙනුම.*





*සැලසුම් අංක 15. කිරිමකුල්ගොල්ල ගුහා අංක 1 හි බිම් සැලසුම සහ පැතිපෙනුම.*





සැලසුම් අංක 16. කිරිමකුල්ගොල්ල ගුහා අංක 2 හි බිම් සැලසුම සහ පැති පෙනුම.





*සැලසුම් අංක 17. කිරිමකුල්ගොල්ල ගුහා අංක 3 හි බිම් සැලසුම සහ පැති පෙනුම.*





*සැලසුම් අංක 18. කිරිමකුල්ගොල්ල ගුහා අංක 4 හි බිම් සැලසුම සහ පැති පෙනුම.*





*සැලසුම් අංක 19. කිරිමකුල්ගොල්ල ගුහා අංක 5 හි බිම් සැලසුම සහ පැති පෙනුම.*





*සැලසුම් අංක 20. ටැම්කැටිය ගුහා අංක 1 හි බිම් සැලසුම සහ පැති පෙනුම.*





*සැලසුම් අංක 21. ටැම්කැටිය ගුහා අංක 2 හි බිම් සැලසුම සහ පැති පෙනුම.*





*සැලසුම් අංක 22. ටැම්කැටිය ගුහා අංක 3 හි බිම් සැලසුම සහ පැති පෙනුම.*





*සැලසුම් අංක 23. ටැම්කැටිය ගුහා අංක 4 හි බිම් සැලසුම සහ පැති පෙනුම.*





සැලසුම් අංක 24. වැලිපොතේයාය ගුහා අංක 1හි බිම් සැලසුම සහ පැති පෙනුම.





*සැලසුම් අංක 25 වැලිපොතේයාය ගුහා අංක 2හි බිම් සැලසුම සහ පැති පෙනුම.*





*සැලසුම් අංක 26. වැලිපොතේයාය ගුහා අංක 4 හි බිම් සැලසුම සහ පැති පෙනුම.*





*සැලසුම් අංක 27. බුදුගල ගුහාවේ බිම් සැලසුම සහ පැති පෙනුම.*




Ground plan of Galtamyaya ancient Buddhist monastery




Ground plan of Budugala Buddhist monastery


TOMB 2
ARCHAEOLOGY DEPARTMENT OFFICE
TOMB 1
ACCESS PATH
ENTRANCE TO THE SITE
ROCK HEWN FLIGHT OF STEPS LEADING TO THE SITE
TEMPORARY HUTS
ACCESS PATH
MOSQUE CONSTRCTED IN 1922
TOMB 3
EXISTING BOUNDARY OF THE ARCHAEOLOGYCAL RESERVE
NEW CONSTRUCTED BUILDINGS BLOCK - B
ARCHAEOLOGICALLY SENSITIVE AREA
BOUNDARY OF EARTH REMOVAL
NEWLY CONSTRUCTED BUILDINGS BLOCK - A
SURVEYED AREA
THE KALTOTA SURVEY 2014 - PHASE I
PLAN OF THE CENTRAL PREMISES IN KURAGALA
BOUNDRY OF THE PROPOSED EXTENSION OF THE ARCHAEOLOGICAL RESERVE
BOUNDRY OF THE EXISTING ARCHAEOLOGICAL RESERVE
600 0 1200 cm